# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

**අංක 13,354— 1962 ඔක්තෝබර් 19 වැනි සිකුරාද — 1962.10.19**

**(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)**

# I වැනි කොටස: (I) වැනි ඡේදය — සාමාන්‍ය

(වෙන වෙන ම ගොනු කර ගත හැකි පරිදි, සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන ම පිටු අංක යොදා ඇත.)


| | පිට | | පිට |
|---|---|---|---|
| අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන ප්‍රකාශන ආදිය ... | — | ආණ්ඩුවේ නිවේදන ... ... ... | 1448 |
| අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත් කිරීම් ආදිය ... | 1445 | මිළ පාලන දැන්වීම් ... ... ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් ආදිය ... | 1446 | ශ්‍රී ලංකා මහා බැංකුවේ දැන්වීම් ... ... | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් ආදිය | 1446 | ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... | 1453 |
| වෙනත් පත් කිරීම් ආදිය ... ... ... | 1447 | ආණ්ඩුවේ වත් කම් හා බැරකම් ප්‍රකාශ ... ... | — |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත් කිරීම් ආදිය ... ... | — | විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... | 1454 |
| | | "සුරාබදු ආඥාපනත" පිළිබඳ දැන්වීම් ... ... | — |


[සැ. යු.—මෙවර ප්‍රසිද්ධ කරනු ලබන ගැසට් පත්‍රයෙහි V වැනි කොටසේ 'කුලී මෝටර් රථ සේවාවන්' පැවැත්වීම සඳහා මගීන් ගෙන යාමේ අවසරපත් ඉල්ලීමේ අයදුම්පත් ලැයිස්තුව පළවන අතර, 1961 ජනවාරි සිට මාර්තු දක්වා මුද්‍රණ ශිල්පීන්ගේ සහ ප්‍රකාශකයින්ගේ ආඥාපනත (179 පරිච්ඡේදය) යටතේ ලියාපදිංචි කරන ලද ලංකාවේ මුද්‍රිත සිංහල පොත් ලැයිස්තුවක්ද මෙම කොටසට අතිරේකයක් වශයෙන් පළවේ.]

## අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත්කිරීම් ආදිය

**1962 අංක 428**

අංකය: ඩී. 21/රෙක් ඩී/133.

**යුද්ධ හමුදුව—නිත්‍ය හට සේනාව—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්**

පහත නම් සඳහන් නිලධාරි තැන 1962 ඔක්තෝබර් මස 1 වැනි දින සිට, යුද්ධ හමුදාවේ නිත්‍ය හට සේනාවෙන් විශ්‍රාම ලබනවා ඇත :—

මේජර් (තාවකාලික ලුතිනන් කර්නල්) ඩග්ලස් වර්නන් බ්‍රොහියර්, ල. සං. බ.

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

ඇන්. කත්‍යු. දියෙස්,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1962 ඔක්තෝබර් 6 වෙනිදා,
කොළඹ දීය.

10-650/1

**1962 අංක 429**

අංකය: ඩී. 158/රෙක් ඩී.

**රාජකීය ලංකා ගුවන් හමුදුව—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්**

පහත සඳහන් නිලධාරියා රාජකීය ලංකා ගුවන් හමුදාවෙන් 1962 නොවැම්බර් මස 1 වැනි දින සිට විශ්‍රාම ගනී :—

බලපංති ලුතිනන් ඇම්. නවරත්නම්—(01007)—පාලන අංශය.

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

ඇන්. කත්‍යු. දියෙස්,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1962 ඔක්තෝබර් 5 වෙනිදා,
කොළඹ දීය.

10-650/2

# රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් කරන පත්කිරීම් ආදිය

**1962 අංක 430**

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පහත සඳහන් පත්කිරීම් කරන ලෙස නියම කර ඇත්තේ ය:—

ඒ. 139/62.

1962 සැප්තැම්බර් මස 10 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු ගුවන් විදුලි සහ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ වැඩබලන සහකාර අධ්‍යක්ෂ ජනරාල් වන සිවිල් සේවක වී. පණ්ඩිත මහතා ස්වකීය රාජකාරිවලට අතිරේකව ශ්‍රී ලංකා ජාතික කලායතනයේ අධ්‍යක්ෂ තනතුරේ වැඩ බැලීමට.

ඒ. 65/62.

1962 සැප්තැම්බර් මස 8 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු සිවිල් සේවක කේ. එච්. ජේ. විජයදාස මහතා ගුවන් විදුලි සහ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ජාතික සේවයේ අධ්‍යක්ෂ වශයෙන් වැඩ බැලීමට.

ඒ. 267/62.

1961 ඔක්තෝබර් මස 1 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු සිවිල් සේවක ඇල්. ඈන්. ද ඇල්. බණ්ඩාරනායක මහතා ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය ගොවිජන සේවා කොමසාරිස් ලෙස වැඩ බැලීමට.

ඒ. 273/62.

1962 අගෝස්තු මස 16 වැනි දින සිට වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ සහකාර වාරිමාර්ග අධ්‍යක්ෂක බී. සෙල්ලහේවා මහතා එම දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය වාරිමාර්ග අධ්‍යක්ෂක වශයෙන්.

ඒ. 272/62.

1962 සැප්තැම්බර් මස 10 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු සිවිල් සේවක ජේ. ජේ. රාජනායගම් මහතා නියෝජ්‍ය වරාය කොමසාරිස් වශයෙන් වැඩ බැලීමට.

ඒ. 270/62.

1962 සැප්තැම්බර් මස 10 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු සිවිල් සේවක ඩබ්ලිව්. ආර්. බී. රාජකරුණා මහතා සංස්කෘතික කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්ෂ වශයෙන් වැඩ බැලීමට.

ඒ. 225/62.

1962 ජූනි මස 1 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු සිවිල් සේවක බී. කේ. සෝමපාල මහතා රේගු දෙපාර්තමේන්තුවේ අතිරේක ගොඩබෑම් සමීක්ෂක හා සහකාර රේගු අයකැමි ලෙස වැඩ බැලීමට.

ඒ. 8/62.

1962 අගෝස්තු මස 27 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු අධිනීතිඥ ඩබ්ලිව්. කේ. ප්‍රේමරත්න මහතා ඇටෝර්නි ජනරාල් දෙපාර්තමේන්තුවේ රජයේ අධිනීතිඥයකු වශයෙන් වැඩ බැලීමට.

ඒ. 29/62.

1962 ජූලි මස 1 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ සහකාර තක්සේරුකරු සී. ද ඒ. ගුණවර්ධන මහතා එම දෙපාර්තමේන්තුවේ තක්සේරුකරු තනතුරක රාජකාරියන් හි යෙදීමට.

එන්. පී. විජයරත්න,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1962 ඔක්තෝබර් මස 15 වැනි දින,
කොළඹ 1, ගාලු මුවදොර මහ ලේකම් ගොඩනැගිල්ලේ,
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේ දීය.
තැ. පෙ. 500.

10-801

---

# අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් කරන පත්කිරීම් ආදිය

**1962 අංක 431**

අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් පහත සඳහන් පත්කිරීම් කර ඇත්තේ ය:—

අංකය : ජේඒ. 11/48 (II)

ඕ. එල්. ද ක්‍රෙට්සර් මහතා 1962 ඔක්තෝබර් මස 8 වැනි දින සිට ඔහුගේ වෙනත් රාජකාරිවලට අතිරේක වශයෙන් කොළඹ දිස්ත්‍රික් උසාවියේ අංක 8,735/එල් දරණ නඩුවේ තීන්දුව දීමට කොළඹ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඒ./11/48.

ඩී. ජේ. ආර්. ගුණවර්ධන මහතා 1962 ඔක්තෝබර් මස 19 වැනි දින සිට ඔහුගේ වෙනත් රාජකාරිවලට අතිරේක වශයෙන් කොළඹ දිස්ත්‍රික් උසාවියේ අංක 51,701/එම්. සහ අංක 51.289/එම් දරණ නඩු අවසාන කිරීමට හා තීන්දුව දීමට කොළඹ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඒ/11/48.

පී. ඒ. ද එස්. සේනාරත්න මහතා 1962 ඔක්තෝබර් මස 8 වැනි දින සිට ඔහුගේ වෙනත් රාජකාරිවලට අතිරේක වශයෙන් කොළඹ දිස්ත්‍රික් උසාවියේ අංක 7,700/එම්.බී., 50,496/එම්, 52,563/එම් සහ එම්. 2.132/19,905 දරණ නඩු අසා අවසාන කිරීමට සහ තීන්දුව දීමට කොළඹ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑම්. 2/56 (III).

එස්. ජේ. එම්. ජී. එස්. මුදන්නායක මහතා 1962 ඔක්තෝබර් මස 1 වැනි දින සිට හෝ නැවත නියමයක් කරන තුරු හලාවත අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට සහ අතිරේක රික්වෙස්ට් කොමසාරිස් ධුරයට, හලාවත අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, පුත්තලමේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට සහ අතිරේක රික්වෙස්ට් කොමසාරිස් ධුරයට සහ පුත්තලමේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඒ 28/48.

එස්. ජේ. එම්. ජී. එස්. මුදන්නායක මහතා 1962 ඔක්තෝබර් මස 9 වැනි දින සිට මතුගම මහෙස්ත්‍රාත් උසාවියේ අංක 39632 සහ 40387 දරණ නඩුවල තීන්දුව දීමට හා කළුතර මහෙස්ත්‍රාත් උසාවියේ අංක 2,821 දරණ නඩුව අසා අවසාන කිරීමට සහ තීන්දුව දීමට ඔහුගේ වෙනත් රාජකාරිවලට අතිරේක වශයෙන් කළුතර අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට සහ කළුතර අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑස්සී/පීපී.9/62.

ඩී. එස්. නෙත්සිංහ මහතා 1962 ඔක්තෝබර් මස 1 වැනි දින සිට හෝ නැවත නියමයක් කරනතුරු ගාල්ලේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට සහ අතිරේක රික්වෙස්ට් කොමසාරිස් ධුරයට, ගාල්ලේ අතිරේක නාගරික මහෙස්ත්‍රාත් ධුරයට සහ ගාල්ලේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 68.සී/51.

සී. වී. උඩලාගම මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු එෆ්. පී. සේනාරත්න මහතා 1962 ඔක්තෝබර් මස 5 වැනි සහ 6 වැනි දිනයන්හි අනුරාධපුරේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, අනුරාධපුර අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට සහ අතිරේක රික්වෙස්ට් කොමසාරිස් ධුරයට, මන්නාරමේ සහ වවුනියාවේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, වවුනියාවේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට, ත්‍රිකුණාමලේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට සහ ත්‍රිකුණාමලේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට.

අංකය : ජේඑල්.27.ඒ/2/57.

එම්. ඒ. එම්. හුසේන් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු එල්. එස්. වී. පෙරේරා මහතා 1962 ඔක්තෝබර් මස 4 වැනි දින සිට 7 වැනි දින දක්වා බදුල්ලේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, සහ බදුල්ල-හල්දුම්මුල්ල අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට සහ අතිරේක රික්වෙස්ට් කොමසාරිස් ධුරයට.

අංකය : ජේඑල්. 23.ඒ/58.

ඒ. ඩබ්ලිව්. ගුණරත්න මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු ඩී. ඒ. ඊ. මීගම මහතා 1962 ඔක්තෝබර් මස 6 වැනි දින සිට 8 වැනි දින දක්වා පානදුරේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට සහ අතිරේක රික්වෙස්ට් කොමසාරිස් ධුරයට, සහ පානදුරේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්.7.ඒ/51 (1).

ඒ. ඕ. එස්. දිසානායක මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු එස්. පී. විජයතිලක මහතා 1962 ඔක්තෝබර් මස 6 වැනි දින සිට 8 වැනි දින දක්වා මාතලේ ක්‍රියා කරන පිණිස මහනුවර අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට සහ මාතලේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට සහ අතිරේක රික්වෙස්ට් කොමසාරිස් ධුරයට.

අංකය : ජේඑල්. 49/48.

එස්. එන්. රාජදුරේ මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, එෆ්. එස්. පෝල් මහතා 1962 ඔක්තෝබර් මස 10 වැනි දින සිට 13 වැනි දින දක්වා මන්නාරමේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට සහ අතිරේක රික්වෙස්ට් කොමසාරිස් ධුරයට සහ මන්නාරමේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්.62.ඒ/60.

බී. එස්. සී. රත්වත්තේ මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු ඒ. එම්. එම්. තාහිර් මහතා 1962 ඔක්තෝබර් මස 11 වැනි දින ගාල්ලේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට සහ අතිරේක රික්වෙස්ට් කොමසාරිස් ධුරයට, ගාල්ලේ අතිරේක නාගරික මහෙස්ත්‍රාත් ධුරයට සහ ගාල්ලේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 48/48 (1).

ඒ. එස්. පොන්නම්බලම් මහතා නැවත වැඩ බාරගන්නාතුරු හෝ නැවත නියමයක් කරනතුරු එස්. එම්. එම්. කාසිම් මහතා 1962 ඔක්තෝබර් මස 9 වැනි දින හලාවත අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, හලාවත අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට සහ අතිරේක රික්වෙස්ට් කොමසාරිස් ධුරයට, පුත්තලමේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට සහ පුත්තලමේ අතිරේක මහෙස්ත්‍රාත් සහ අතිරේක රික්වෙස්ට් කොමසාරිස් ධුරයට.

අංකය : ජේඑල්. 48/48.

ඒ. එස්. පොන්නම්බලම් මහතා නැවත වැඩ බාරගන්නා තුරු හෝ නැවත නියමයක් කරනතුරු සී. ඒ. එල්. කොරෙයා මහතා 1962 ඔක්තෝබර් මස 8 වැනි දින සිට හලාවත අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, හලාවත අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට සහ අතිරේක රික්වෙස්ට් කොමසාරිස් ධුරයට, පුත්තලමේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට සහ පුත්තලමේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට සහ අතිරේක රික්වෙස්ට් කොමසාරිස් ධුරයට.

අංකය : ජේඑල්. 6.සී/52.

වී. එම්. කුමාරස්වාමි මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු වී. කනගසබෙයි මහතා 1962 ඔක්තෝබර් මස 15 වැනි දින සිට 17 වැනි දින දක්වා සහ නැවත 29 වැනි දින පේදුරු තුඩුවේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, සහ පේදුරුතුඩුවේ අතිරේක මහෙස්ත්‍රාත් සහ අතිරේක රික්වෙස්ට් කොමසාරිස් ධුරයට.

අංකය : ජේඑල්.

එල්. එච්. ද අල්විස් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, එෆ්. වී. එච්. ලාබ්රෝයි මහතා 1962 නොවැම්බර් මස 19 වැනි දින සිට 21 වැනි දින දක්වා නුවරඑළියේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, නුවරඑළියේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට සහ අතිරේක රික්වෙස්ට් කොමසාරිස් ධුරයට, නුවර එළියේ අතිරේක නාගරික මහෙස්ත්‍රාත් ධුරයට, සහ බදුල්ල-හල්දුම්මුල්ල අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට.

අංකය : ජේඑල්/66. ඒ/54 (II)

ඕ. එල්. ද ක්‍රෙට්සර් සහ සී. තනබාලසිංහම් යන මහත්වරුන් නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, වී. මුතුසාමිපිල්ලේ මහතා 1962 ඔක්තෝබර් මස 8 වැනි දින යාපනයේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, සහ යාපනයේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට සහ අතිරේක රික්වෙස්ට් කොමසාරිස් ධුරයට.

අංකය : ජේඑල්. 51.ඒ/54.

ටී. ජේ. රාජරත්නම් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, සී. එච්. උඩලාගම මහතා 1962 ඔක්තෝබර් මස 10 වැනි දින සිට 12 වැනි දින දක්වා කෑගල්ලේ අතිරේක මහෙස්ත්‍රාත් සහ අතිරේක රික්වෙස්ට් කොමසාරිස් ධුරයට සහ කෑගල්ලේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 42.ඒ/53.

ඩී. පී. තිසංග මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, ජේ. ඩබ්ලිව්. වික්‍රමසිංහ මහතා 1962 ඔක්තෝබර් මස 29 වැනි සහ 30 වැනි දිනයන්හි මාතර අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, මාතර අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට සහ අතිරේක රික්වෙස්ට් කොමසාරිස් ධුරයට සහ තංගල්ලේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 54. ඒ/56.

එල්. සමරතුංග මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු සී. එල්. ද සිල්වා මහතා 1962 නොවැම්බර් මස 5 වැනි දින සිට 9 වැනි දින දක්වා බලපිටියේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට සහ බලපිටියේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට සහ රික්වෙස්ට් කොමසාරිස් ධුරයට.

අංකය : ජේඒ. 12/48.

ජේ. එන්. සී. තිරුචෙල්වම් මහතා 1962 ඔක්තෝබර් මස 9 වැනි දින සිට කොළඹ මහෙස්ත්‍රාත් උසාවියේ අංක 21,657/බී සහ 14,984/බී දරණ නඩුවල තීන්දුව දීමට සහ කොළඹ මහෙස්ත්‍රාත් උසාවියේ අංක 13,159/බී දරණ නඩුව අසා අවසාන කිරීමට සහ තීන්දුව දීමට කොළඹ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට සහ කොළඹ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : පීඑල්/එම්. 5/54.

ඊ. එම්. මත්‍යපෙරනාම් මහතා වෙනත් රාජකාරිවල යෙදී සිටින අතර හෝ නැවත නියමයක් කරනතුරු, ආර්. වී. වල්වරාජා මහතා 1962 ඔක්තෝබර් මස 9 වැනි සහ 10 වැනි දිනයන්හි වවුනියා සහ මන්නාරම දිස්ත්‍රික්කවල දකුණු වවුනියාවේ ගම්බද උසාවි සභාපති වශයෙන් සහ මාන්ටෙයි අතිරේක ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඒ. 55/57.

ඩී. සී. විජේසිංහ මහතා, 1962 නොවැම්බර් මස 1 වැනි දින දෙහිඕවිට ගම්බද උසාවියේ අංක 5,081 දරණ අපරාධ නඩුව ඇසීම සඳහා අවිස්සාවේල්ල දිස්ත්‍රික්කයේ, දෙහිගම්පල් කෝරළේ සහ පාත බුලත්ගම සහ ඇතුළුගම් හා පනාවල් කෝරළයන්හි අතිරේක ගම්බද උසාවි සභාපති වශයෙන් හා බෙලිගල් සහ කුරුවිටි කෝරළයන්හි අතිරේක ගම්බද උසාවි සභාපති වශයෙන්.

අංකය : පීඑල්/ඒ.5/53.

ඒ. බී. අළුවිහාරේ මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, 1962 ඔක්තෝබර් මස 6 වෙනි දින එස්. එච්. සිරිවර්ධන මහතා අවිස්සාවේල්ල දිස්ත්‍රික්කයේ, දෙහිගම්පල් කෝරළේ සහ පාත බුලත්ගම සහ ඇතුළුගම් සහ පනාවල් කෝරළයන්හි ගම්බද උසාවි සභාපති වශයෙන් හා බෙලිගල් සහ කුරුවිට කෝරළයන්හි ගම්බද උසාවි අතිරේක සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/ඒ. 5/53.

ඒ. බී. අළුවිහාරේ මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ඩී. සී. විජේසිංහ මහතා 1962 ඔක්තෝබර් මස 5 වැනි දිනයන්හි අවිස්සාවේල්ල දිස්ත්‍රික්කයේ දෙහිගම්පල් කෝරළේ සහ පාත බුලත්ගම සහ ඇතුළුගම් සහ පනාවල් කෝරළයන්හි ගම්බද උසාවි සභාපති වශයෙන් හා බෙලිගල් සහ කුරුවිටි කෝරළයන්හි අතිරේක ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/ආර්. 4/50.

එස්. ටී. රාජරත්නම් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, එන්. එතම්පෙරුම් මහතා 1962 ඔක්තෝබර් මස 13 වැනි දින යාපන දිස්ත්‍රික්කයේ බස්නාහිර වලිකාමම් සහ දූපත්වල ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/ඩී. 10/62.

සී. ජී. එල්. ද අල්විස් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, එම්. වික්‍රමතුංග මහතා 1962 ඔක්තෝබර් මස 5 වෙනි දින මාතර දිස්ත්‍රික්කයේ වැල්ලබොඩ පත්තුවේ කඩවත් සතරේ සහ වැලිගම් කෝරළේ ගම්බද උසාවි සභාපති වශයෙන් සහ ගඟබොඩ පත්තුවේ අතිරේක ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

ඇන්. ඒ. ද ඇස්. විජේසේකර,
අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1962 ඔක්තෝබර් මස 11 වැනි දින,
අධිකරණ සේවා කොමිෂන් සභා කාර්යාලය,
තැ. පෙ. අංක 573,
කොළඹ 12.

10-672

---

## වෙතන් පත්කිරීම් ආදිය

**1962 අංක 432**

අංකය : අයිඑන් ක්‍යු/එල්. 9/2/57.

(20 වෙනි පරිච්ඡේදය වන) ක්‍රිමිනල් නඩු විධාන සංග්‍රහයේ 120 වෙනි වගන්තිය යටතේ ගරු අධිකරණ ඇමතිතුමා විසින්—

1962 සැප්තැම්බර් මස 12 වෙනි දින සිට කේ. රාමනාදන් මහතා නැවත වැඩ භාරගන්නාතුරු යාපනය දිස්ත්‍රික්කයේ බෙල්ජ්, කයිට්ස්හි හදිසි මරණ පරීක්ෂක ධුරයේ වැඩ බැලීමට ඊ. යනවරායර් මහතාද,

අංකය : අයිඑන් ක්‍යු/එල්. 14/4/58.

1962 සැප්තැම්බර් මස 10 වෙනි දින සිට එච්. පී. හේරත් මහතා නැවත වැඩ භාරගන්නාතුරු කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කුලියාපිටිය ප්‍රදේශයේ හදිසි මරණ පරීක්ෂක ධුරයේ වැඩ බැලීමට ජේ. එච්. කරුණාරත්න මහතාද,

අංකය : අයිඑන් ක්‍යු/එල්. 18/4/62.

1962 ඔක්තෝබර් මස 1 වෙනි දින සිට ඩබ්ලිව්. බී. හිඟුරුකඩුව මහතා නැවත වැඩභාරගන්නාතුරු බදුල්ල දිස්ත්‍රික්කයේ කඳුකර කෝරළයේ හදිසි මරණ පරීක්ෂක ධුරයේ වැඩ බැලීමට පී. ඒ. වනසිංහ මහතාද,

අංකය : ඒ.අයි. 7/2/60.

1962 සැප්තැම්බර් මස 19 වෙනි දින සිට මාතර දිස්ත්‍රික්කයේ වැල්ලබඩ පත්තුවේ අපරැක්ක ප්‍රදේශයේ හදිසි මරණ පරීක්ෂක ධුරයට හේවා කොතලාවලගේ ඩේවිඩ් මහතාද,

අංකය: ඒ.අයි. 14/9/51.

1962 ඔක්තෝබර් මස 2 වෙනි දින සිට ස්ථිර පත්කිරීමක් කරන තුරු, කුරුණෑගල දිස්ත්‍රික්කයේ වැඩුඩ කෝරළේ හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි වැඩ බැලීමට බී. ඇම්. කේ. දසනායක මහතාද,

අංකය : ඒ.අයි. 14/1/62.

1962, ඔක්තෝබර් මස 2 වෙනි දින සිට ස්ථිර පත්කිරීමක් කරන තුරු, කුරුණෑගල දිස්ත්‍රික්කයේ හේවාවිස්ස කෝරළයේ හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි වැඩ බැලීමට ඩබ්ලිව්. එල්. පී. ජයසිංහ මහතාද,

අංකය : ඒ.අයි.20/1/57(1).

1962, අගෝස්තු මස 26 වෙනි දින සිට මාඩාර් මරික්කාර් මහතා නැවත වැඩ භාරගන්නාතුරු පුත්තලම් දිස්ත්‍රික්කයේ කල්පිටිය ප්‍රදේශයේ හදිසි මරණ පරීක්ෂක ධුරයේ වැඩ බැලීමට මොහමඩ් අබුසලිනු ලෙබ්බේ මහතාද,

අංකය : ඒ.අයි. 20/1/61.

1962, සැප්තැම්බර් මස 19 වෙනි දින සිට ස්ථිර පත්කිරීමක් කරනතුරු, මහනුවර දිස්ත්‍රික්කයේ ගම්පොල අධිකරණ කොට්ඨාශයේ උඩ පළාත කඳුකර පහල කෝරලයේ හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි වැඩබැලීමට කේ. පී. පියදාස මහතාද,

1962, ඔක්තෝබර් මස 1 වැනි දින සිට ස්ථිර පත්කිරීමක් කරන තුරු මාතලේ දිස්ත්‍රික්කයේ ගම්පහසිය පත්තුවේ (දකුණු මාතලේ) ප්‍රදේශයේ හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි වැඩබැලීමට ටී. විමලසිංහ මහතාද,

1962 ඔක්තෝබර් මස 1 වෙනි දින සිට ස්ථිර පත්කිරීමක් කරන තුරු මාතලේ දිස්ත්‍රික්කයේ ගම්පහසිය පත්තුවේ (දකුණු මාතලේ) හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි වැඩබැලීමට ටී. ඇම්. කුමාරසිංහ මහතාද,

1962, ඔක්තෝබර් මස 1 වෙනි දින සිට ස්ථිර පත්කිරීමක් කරන තුරු මාතලේ ගල්ගල පල්ලේසිය පත්තුවේ හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි වැඩබැලීමට එච්. බී. රත්නායක මහතාද,

1962, ඔක්තෝබර් මස 1 වෙනි දින සිට ස්ථිර පත්කිරීමක් කරන තුරු මාතලේ දිස්ත්‍රික්කයේ, ගඟුල පල්ලේසිය පත්තුවේ හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි වැඩබැලීමට ඒ. ටී. සිලඅප්පුහාමි මහතාද,

1962, ඔක්තෝබර් මස 1 වෙනි දින සිට ස්ථිර පත්කිරීමක් කරන තුරු මාතලේ දිස්ත්‍රික්කයේ මැදසිය පත්තුවේ (දකුණු මාතලේ) හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි වැඩ බැලීමට ඩී. කේ. පණ්ඩිත රත්න මහතාද,

1962, සැප්තැම්බර් මස 1 වෙනි දින සිට ස්ථිර පත්කිරීමක් කරන තුරු නුවරඑළිය දිස්ත්‍රික්කයේ, උඩ පුස්සැල්ලාව කොට්ඨාශයේ හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි වැඩ බැලීමට වයි. ඇම්. පිකිරි බණ්ඩා මහතාද,

1962, ඔක්තෝබර් මස 1 වෙනි දින සිට ස්ථිර පත්කිරීමක් කරන තුරු කළුතර දිස්ත්‍රික්කයේ ගෝවින්නේ, වරකාගොඩ විදාන ආරච්චි කොට්ඨාශයේ හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි වැඩබැලීමට ඩී. බී. ඩබ්ලිව්. විජේගුණවර්ධන මහතාද,

1962, සැප්තැම්බර් මස 1 වෙනි දින සිට ස්ථිර අත්කිරීමක් කරන තුරු කුරුණෑගල දිස්ත්‍රික්කයේ බලදොර කෝරලේ හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි වැඩ බැලීමට ඒ. වන්නිතිලක මහතාද,

1962, අගෝස්තු මස 1 වෙනි දින සිට ස්ථිර පත්කිරීමක් කරන තුරු කුරුණෑගල දිස්ත්‍රික්කයේ මයුරාවතී කෝරලේ හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි වැඩ බැලීමට පී. බී. මැදගොඩ මහතාද,

පත්කර ඇත්තේ ය.

ඩී. ජේ. ආර්. ගුණවර්ධන,
අධිකරණ අමාත්‍යාංශයේ වැඩබලන
ස්ථිර ලේකම්.

1962, ඔක්තෝබර් මස 10 වෙනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේදීය.

10-662

---

1962 අංක 433

අංකය : ඒජේ. 39/1/62.

අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ ගරු අධිකරණ අමාත්‍යවරයා කෙරෙහි පවරා ඇති බලතල අනුව එතුමා විසින්—

1. එස්. එස්. ජයවර්ධන මහතා ගාලු අධිකරණ දිස්ත්‍රික්කය වෙනුවෙන් සමාදාන විනිශ්චයකරුවකු වශයෙන්ද,
2. පී. එම්. විතාන මහතා අනුරාධපුර අධිකරණ දිස්ත්‍රික්කය වෙනුවෙන් සමාදාන විනිශ්චයකරුවකු වශයෙන්ද පත්කර ඇත්තේ ය.

ඩී. ජේ. ආර්. ගුණවර්ධන,
අධිකරණ අමාත්‍යාංශයේ වැඩ බලන ස්ථිර ලේකම්.

1962 ඔක්තෝබර් මස 15 වෙනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේදීය.

10-796

---

1962 අංක 434

## දැන්වීමයි

උපාලි විජයරත්න ජයසූරිය මහතා කොළඹ අධිකරණ කොට්ඨාශය ඇතුළත ඉංග්‍රීසි භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් කර්මාන්ත, සවදේශ සහ සංස්කෘතික කටයුතු පිළිබඳ ගරු අමාත්‍යතුමා විසින් පත්කර තිබේ.

කර්මාන්ත, සවදේශ සහ සංස්කෘතික
කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ සථිර ලේකම්.

1962 ඔක්තෝම්බර් මස 5 වැනි දින,
කොළඹ දීය.

10-603

---

# ආණ්ඩුවේ නිවේදන

අ. ආ. කා. අංකය : ඕ.310/48.

චෙකොස්ලොවේකියා සමූහාණ්ඩුවේ සුවිශෙෂ හා පූර්ණ බලැති තානාපති වශයෙන් ලංකාවේ පෙනී සිටීමට බලය පවරනු ලැබූ ආචාර්ය අයිවන් රොහාල්-ඉල්කිව් උතුමාණන් වහන්සේගේ අක්ත පත්‍රය, අනෙකශ්‍රීන් විරාජමාන මහා රාජෝත්තමීන් වහන්සේ වෙනුවෙන්, අග්‍රාණ්ඩුකාර තුමා සතුටින් භාරගත්හ.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,
සී. ජ. වල්පිට,
අග්‍රාණ්ඩුකාරතුමාගේ ලේකම්.

1962 ඔක්තෝබර් 9 වැනි දින,
කොළඹ, අග්‍රාණ්ඩුකාරතුමාගේ කාර්යාලයේ දී.

10-568

---

ඇල් ඩී-බී. 89/52.

### තෑනායම් පනත

ආණ්ඩුවේ දේශ සංචාරක කායභාංශයේ අධ්‍යක්ෂ යටතේ පාලනය වන තානායම් සම්බන්ධව 1956 යේ 43 වැනි අංකය දරන ආඥාපනතෙන් සංශෝධිත තානායම් පනතේ (275 වැනි පරිච්ඡෙදය) 4 වැනි ඡේදයේ 2ඒ. වැනි උප ඡේදය යටතේ අගමැති සහ ආරක්ෂක හා විදේශ කටයුතු භාර ඇමති විසින් පනවන රෙගුලාසියයි.

සිරිමා ආර්. ඩී. බණ්ඩාරනායක,
අගමැති සහ
ආරක්ෂක හා විදේශ කටයුතු භාර ඇමති.

කොළඹ 1,
1962 ඔක්තෝබර් 11 දින දීය.

#### රෙගුලාසිය

1960 නොවැම්බර් 25 වැනි දින සහ 12,235 වැනි අංකය දරන ගැසට් පත්‍රයේ පළකරන ලද 1960 ආණ්ඩුවේ දේශ සංචාරක කායභාංශයේ තානායම් රෙගුලාසි යටතේ 1 වැනි උපලේඛනය මෙසේ සංශෝධනය කරනු ලැබේ :—

1. " ඒ " ශ්‍රේණිය යටතේ තිස්සමහාරාම තානායම යන විෂයට පසු පහත සඳහන් විෂයයන් එකතු කිරීමෙන් :

" (11) තිස්ස වැව තානායම
(12) නුවර වැව තානායම
(13) හබරන තානායම ".

2. " බී " ශ්‍රේණිය යටතේ තිබෙන සියලුම විෂයයන් වෙනුවට පහත සඳහන් විෂයයන් එකතු කිරීමෙන් :

" (1) හංවැල්ල තානායම
(2) කන්තලේ තානායම
(3) කිතුල්ගල තානායම ".

10-691

---

අංකය : 543ජී/141ඩී (II කොටස).

මෙයට ඇතුලත් උප්ලේඛනයෙහි II වැනි තීරයෙහි නියමිත දෙපාර්තමේන්තුවෙහි එයට අනුරූපව I වැනි තීරයෙහි නියමිත එක් එක් තනතුර දරන හැම තැනැත්තකුම ඒ තනතුරට පත් කරනු ලැබූ දිනයෙහි සිට, විශ්‍රාම වැටුප් ලැබීමට හිමිකම් ඇත්තකු බව විශ්‍රාම වැටුප් ව්‍යවස්ථාවල 2 වැනි වගන්තිය ප්‍රකාර මෙයින් දන්වනු ලැබේ.

හෙ. ජිනදාස,
වැ. භාණ්ඩාගාරයේ ලේකම්.

1962 සැප්තැම්බර් 30 වැනි දින,
කොළඹ, මහා භාණ්ඩාගාරයේ දීය.

### උපලේඛනය

| I වැනි තීරය | II වැනි තීරය |
| --- | --- |
| කසල ශෝධක කම්කරු හා උයන් කම්කරු මැෂින් ෆිටර් | විභාග |
| ප්‍රවාහණ නිලධාරි ... | වන සංරක්ෂණ |
| මුළුතැන් ගෙයි සහායකයින්, භෝජනාගාර සේවකයින්, මෙස් භෝජනාගාර සේවක යින් ... | රාජකීය ලංකා ගුවන් හමුදාව |
| ලේකම් ... | ණය සහනදායක මණ්ඩලය |
| ග්‍රාම සේවකයන් ... | කම්මාන්ත, ස්වදේශ සහ සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශය (දිස්ත්‍රික්ක පාලනය) |

10-626/1

---

543ඊ/141බී (II කොටස)

මෙහි පහත නියමිත තනතුරු දරන්නන් විශ්‍රාම වැටුප්වලට හිමිකම් ඇත්තන් බව විශ්‍රාම වැටුප් ව්‍යවස්ථාවල 2 වැනි වගන්තිය ප්‍රකාර මෙයින් දන්වනු ලැබේ :—

**සෞඛ්‍ය දෙපාර්තමේන්තුව**

ශුභ සාධක නිලධාරි (වී.ඒ.මුණසිංහ මහතා විසින් දරන අතර)
ශුභ සාධක නිලධාරිනි (අයි. එම්. සමරවීර මෙනෙවිය විසින් දරන අතර)

ෆෙ. ජිනදාස,
වැ. භාණ්ඩාගාරයේ ලේකම්.

1962 සැප්තැම්බර් 30 වැනි දින,
කොළඹ, මහා භාණ්ඩාගාරයේ දීය.

10-626/2

---

## 1958 අඩක 10 දරණ සමගි මණ්ඩල පනත

**ආඥාව**

1958 අංක 10 දරණ සමගි මණ්ඩල පනතෙහි 3 වෙනි වගන්තියේ (1) හා (8) වෙනි උප වගන්තිවලින් හා 4 වෙනි වගන්තියේ (1) වෙනි උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල පරිදි, අධිකරණ අමාත්‍ය සැමුවෙල් පීටර් ක්‍රිස්ටෝපර් ප්‍රනාන්දු වන මම, මෙයින්—

(අ) පහත සඳහන් තැනැත්තන් කොළඹ දිස්ත්‍රික්කයේ දකුණු අළුත්කුරු කෝරලයේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ පිහිටි කනුවන ගම්ප්‍රදේශය සඳහා සමන්විත සමගි මණ්ඩලයේ සාමාජිකයන් වශයෙන් පත්කරමි :—

(1) කොටරුපේ පදිංචි සෙනෙට් මන්ත්‍රී අබේසේකර වනක්කු ආරච්චිගේ දොන් සමරදිවාකර ජයසේකර මහතා.
(2) රාගම පදිංචි ෂෙල්ටන් පෙරේරා අමරසේකර මහතා.
(3) රාගම පදිංචි හෙට්ටියාදුර පීටර් සිල්වා මහතා.
(4) ඒකල පදිංචි අතුකෝරාලලාගේ වලෙන්තීනු අප්පුහාමි මහතා.
(5) කලඑලිය පදිංචි එම්. සයිමන් කොස්තා මහතා.
(6) රද්දොළුව පදිංචි බද්දේලියනගේ දොන් රූබන් පෙරේරා මහතා.
(7) කනුවන පදිංචි ජයසූරිය කුරණගේ මෝසස් පෙරේරා මහතා.
(8) හොරපෙ පදිංචි උභයතිලක ආරච්චිගේ දොන් වලිසිංහ මහතා.
(9) රාගම පදිංචි ඇත්මඩලගේ පීටර් පෙරේරා මහතා.
(10) දකුණු බටගම පදිංචි දොන් අන්සල් ජයකොඩි මහතා.
(11) වැලිගම්පිටිය පදිංචි ගම්පලවඩුගේ බෙනඩික් පොන්සේකා මහතා.
(12) තුඩැල්ල පදිංචි කුරණගේ ජෝෂප් ඇල්බට් පෙරේරා මහතා.
(13) අලවතුපිටිය පදිංචි පිටිපනගේ බෙනඩික් ප්‍රනාන්දු මහතා.
(14) රද්දොලුව පදිංචි ගී කියනගේ චන්ද්‍රසේකර ගුණතිලක මහතා.
(15) ගනේපොල පදිංචි අභයසේකර වන්නකු ආරච්චිගේ දොන් ස්ටීවන් ධීරසේකර මහතා.
(16) කොටුගොඩ පදිංචි කෝරලගමගේ මවුලියන් ප්‍රනාන්දු මහතා.
(17) ඒකල, කුරුඳුවත්ත පදිංචි මැලියාගොඩ සිසිල් ඇල්ප්‍රඩ් ද සිල්වා මහතා.
(18) වැලිගම්පිටිය පදිංචි ඇන්තනි රත්නායක මහතා.
(19) රාගම පදිංචි ජයමුනි පේද්‍රික් ද සිල්වා මහතා.
(20) ගනේපොල කොටරුපේ පදිංචි ජයකොඩි අරාච්චිගේ ජෝෂප් ජයකොඩි මහතා.
(21) ගනේපොල කොටරුපේ පදිංචි එර්නස්ට් විජයවර්ධන ජයතිලක මහතා.
(22) ගනේපොල-කොටරුපේ පදිංචි හෙනරත් හෙට්ටිආරච්චිගේ දොන් නෝරිස් සෙනෙවිරත්න මහතා.
(23) තුඩැල්ල පදිංචි දොන් ජොහැන්නස් වීරක්කොඩි මහතා.
(24) දලතුරේ පදිංචි කේ. අයි. පෙරේරා මහතා.
(25) දඹුගම පදිංචි පොල්වත්තගේ විල්බට් අමරදාස කොස්තා මහතා.
(26) දකුණු බටගම—හපුගොඩ පදිංචි දෙන් ඇන්ඩෘ රාමනායක මහතා.

(ආ) ඉහතකී මණ්ඩලයේ සභාපති වශයෙන් කොටරුපේ පදිංචි සෙනෙට් මන්ත්‍රී, අබේසේකර වනක්කු ආරච්චිගේ දොන් සමරදිවාකර ජයසේකර මහතා පත්කරමි; තවද,

(ඇ) එබඳු එක් එක් සාමාජිකයා නිලය දැරිය යුතු කාලසීමාව, මේ ආඥාව ගැසට් පත්‍රයෙහි පළකරනු ලබන දින සිට අවුරුදු දෙකක් වියයුතු යයි නිශ්චය කරමි.

සැම්. පී. සී. ප්‍රනාන්දු,
අධිකරණ ඇමති.

1962, ඔක්තෝබර් මස 9 වෙනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේදී ය.
10-604

---

## 1958 අඩක 10 දරණ සමගි මණ්ඩල පනත

**3 (2) වෙනි වගන්තිය යටතේ කරණලද දැන්වීමයි**

1958 අංක 10 දරණ සමගි මණ්ඩල පනතේ 3 වෙනි වගන්තියේ 2 වෙනි උප වගන්තියේ විධිවිධාන අනුව, අධිකරණ ඇමති තැන්පත්, සැමුවෙල් පීටර් ක්‍රිස්ටෝපර් ප්‍රනාන්දු වන, මම, මෙහි ඇති උපලේඛනයේ සඳහන් එක් එක් ගම් ප්‍රදේශයක් සඳහා සමගිදායකයින්ගේ සභාවක් බැගින් පිහිටුවීමට අදහස්කර ඇති බව සහ ඒ ගම් ප්‍රදේශයේ ගම්කායයී සභාවද, ඒ ගම්ප්‍රදේශයේ සෑම ග්‍රාමසංවර්ධන සමිතියක් හා සෑම ප්‍රජාමණ්ඩලයක්ද, සමුපකාර සමිති ආඥාපනත යටතේ ලියාපදිංචි කරනු ලැබූ ඒ ගම්ප්‍රදේශයේ සෑම සමුපකාර සමිතියක්ද විසින්, නිර්දේශ මණ්ඩලයේ මතය පරිදි, ඒ සභාවේ සාමාජිකයන් වීමට සුදුසු තැනැත්තන්, 1962 නොවැම්බර් මස 20 වෙනි දින හෝ ඊට පළමු, මා වෙත නිර්දේශ කළහැකි බව, මෙයින් දන්වමි.

සැම්. පී. සී. ප්‍රනාන්දු,
අධිකරණ ඇමති.

1962, ඔක්තෝබර් මස 9 වෙනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේදීය.

### උපලේඛනය

1. කොළඹ දිස්ත්‍රික්කයේ නැගෙනහිර සියනෑකෝරලේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ පිහිටි එගොඩපොත ගම්ප්‍රදේශය.
2. කොළඹ දිස්ත්‍රික්කයේ හාපිටිගම් කෝරලේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ පිහිටි උඩුගහ ගම්ප්‍රදේශය.
3. කොළඹ දිස්ත්‍රික්කයේ බටහිර සියනෑකෝරලේ (මැදපත්තුව) ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ පිහිටි හෙනරත්ගොඩ ගම්ප්‍රදේශය.
4. කොළඹ දිස්ත්‍රික්කයේ කොළඹ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ පිහිටි කෝට්ටේ-ගල්කිස්ස ගම්ප්‍රදේශය.
5. කලුතර දිස්ත්‍රික්කයේ කලුතර තොටමුණ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ පිහිටි පයියාගල සහ මග්ගොන් බදු ගම්ප්‍රදේශය.
6. ගාලු දිස්ත්‍රික්කයේ නැගෙනහිර බෙන්තොට වලල්ලාවිට කෝරලේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ පිහිටි ඇල්පිටිය ගම්ප්‍රදේශය.
7. මාතර දිස්ත්‍රික්කයේ ගඟබඩ පත්තුවේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ පිහිටි මොලොද්දුව ගම්ප්‍රදේශය.
8. මාතර දිස්ත්‍රික්කයේ මොරවක් කෝරලේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ පිහිටි බෙරලපනාතර ගම්ප්‍රදේශය.
9. මාතර දිස්ත්‍රික්කයේ කන්දබඩ පත්තුව ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ පිහිටි හක්මන-වලකඩ ගම්ප්‍රදේශය.

10-605

---

## 1958 අඩක 10 දරණ සමගි මණ්ඩල පනත

**ආඥාව**

1958 අංක 10 දරන සමගි මණ්ඩල පනතෙහි 3 වෙනි වගන්තියේ (I) හා (8) වෙනි උපවගන්තිවලින් හා 4 වෙනි වගන්තියේ (1) වෙනි උප වගන්තියෙන් මාවෙත පැවරී ඇති බලතල පරිදි, අධිකරණ අමාත්‍ය සැමුවෙල් පීටර් ක්‍රිස්ටෝපර් ප්‍රනාන්දු වන මම, මෙයින්—

(අ) පහත සඳහන් තැනැත්තන් මාතලේ දිස්ත්‍රික්කයේ, දකුණු මාතලේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ පිහිටි මාතලේ මැදසිය පත්තු ගම් ප්‍රදේශය සඳහා සමන්විත සමගි මණ්ඩලයේ සමාජිකයන් වශයෙන් පත්කරමි :—

(1) උකුවෙල, කලල්පිටිය පදිංචි පූජ්‍ය අම්පිටියේ ධම්මපාල ස්ථවිරයන් වහන්සේ.

(2) වරකාමුර පදිංචි, උදුමා ලෙබ්බේ අබ්දුල් මජීඩ් මහතා.
(3) උකුවෙල, කටුදෙනිය පදිංචි, රාජපක්ෂ කරුණාධිපති වාසල මුදියන්සේලා ඉහළ වලව්වේ ටිකිරිබණ්ඩා රාජපක්ෂ මහතා.
(4) උකුවෙල, කටුදෙනිය පදිංචි, හෙට්ටි ආරච්චිගෙ නිමල් රණතුංග මහතා.
(5) වාරියපොල පදිංචි, යොතුවලැගෙදර ටිකිරිබණ්ඩා මහතා.
(6) බෝවත්ත පදිංචි, ඩබ්ලිව්. එම්. ඩිංගිරි බණ්ඩා මහතා.
(7) ගුරුලවෙල පදිංචි, ගගේගෙදර එලියෙස් මහතා.
(8) මාරුකොන පදිංචි, සරීප් දීන් ආරච්චි අබ්දුල් ජලීල් මහතා.
(9) කඩුවෙල පදිංචි, ආර්. දොන් එඩ්වින් රත්නායක මහතා.
(10) උල්පතපිටිය පදිංචි, හාරුන් මුස්තාපා මහතා.
(11) කිවුල පදිංචි, ගල්පොත්තේ ගෙදර ගුණදස මහතා.
(12) නුගපිටිය පදිංචි, පී. ජී. ඩිංගිරි අප්පු මහතා.
(13) අළුපොතුවල පදිංචි ඩී. රණසිංහ මහතා.
(14) කඩුවෙල පදිංචි, සී. එස්. දිසානායක මහතා.
(15) කඩුවෙල පදිංචි, ඒ. බී. අලගොඩ මහතා.
(16) නුගපිටිය පදිංචි, අප්පුකුට්ටි ආරච්චිලාගේ කොරනේලිස් අප්පුහාමි මහතා.
(17) නුගපිටිය පදිංචි, මැදවත්තේ ගෙදර රන්නයිදේ මහතා.
(18) රයිතලාවේල පදිංචි, හර්බට් වික්ටර් බණ්ඩාර දොරකුඹුර මහතා.
(19) වරකාමුර පදිංචි, මුහම්මදු ලෙබ්බේ මුහම්මදු සුසෙන් ලෙබ්බේ මහතා.
(20) බෝවත්ත පදිංචි, කහවත්තේ මුදියන්සේලාගේ කිරි බණ්ඩා මහතා.
(21) මතාබොඩ පදිංචි, වයි. එල්. එම්. ඉබ්‍රාහිම් ආලිම් සාහිබු මහතා.
(22) මතාබොඩ පදිංචි, එන්. එම්. කරුණාරත්න මහතා.

(ආ) ඉහතකී මණ්ඩලයේ සභාපති වශයෙන් වරකාමුර පදිංචි, උදුමා ලෙබ්බේ අබ්දුල් මජීඩ් මහතා පත්කරමි ; තවද,

(ඇ) එබඳු එක් එක් සාමාජිකයා නිලය දැරිය යුතු කාලසීමාව, මේ ආඥාව ගැසට් පත්‍රයෙහි පළකරනු ලබන දින සිට අවුරුදු 2ක් වියයුතු යයි නිශ්චය කරමි.

සැම් පී. සී. ප්‍රනාන්දු,
අධිකරණ අමාත්‍ය.

1962, ඔක්තෝබර් මස 9 වෙනි දින,
කොළඹදීය.

10-606

---

## 1958 අංක 10 දරණ සමගි මණ්ඩල පනත

### ආඥාව

1958 අංක 10 දරණ සමගි මණ්ඩල පනතෙහි 3 වෙනි වගන්තියේ (1) හා (8) වෙනි උප වගන්ති වලින් හා 4 වෙනි වගන්තියේ (1) වෙනි උප වගන්තියෙන් මාවෙත පැවරී ඇති බලතල පරිදි, අධිකරණ අමාත්‍ය සැමුවෙල් පීටර් ක්‍රිස්ටෝපර් ප්‍රනාන්දු වන මම මෙයින්—

(අ) පහත සඳහන් තැනැත්තන් කොළඹ දිස්ත්‍රික්කයේ උතුරු අළුත්කුරු කෝරළේ (බී කොටසේ) ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ පිහිටි ගොඩකහපළාත ගම් ප්‍රදේශය සඳහා සමන්විත සමගි මණ්ඩලයේ සාමාජිකයන් වශයෙන් පත් කරමි :—

(1) දාගොන්න ශ්‍රී ප්‍රබෝධනාරාමයේ පදිංචි පූජ්‍ය තිල්පනාගොඩ දීරානන්ද ස්ථවිරයන් වහන්සේ.
(2) බටහිර කළුවාඉරිප්පුව පදිංචි සැම් විල්ප්‍රඩ් ඇලෝසියස් සෙනෙවිරත්න මහතා.
(3) දිවුලපිටියේ හෙන්පිටගෙදර පදිංචි පියසේන පෙරේරා රණසිංහ මහතා.
(4) දූනගහ පදිංචි ඒ. පී. කන්නන්ගර මහතා.
(5) දූනගහ පදිංචි එස්. එන්. වික්‍රමසිංහ මහතා.
(6) අළුතපොල පදිංචි හීන්බණ්ඩා මුදලිගේ ප්‍රේමරත්න මහතා.
(7) කටුවැල්ලේගම පදිංචි හෙට්ටිඅච්චි කංකානමලාගේ ජේම්ස් අප්පුහාමි මහතා.
(8) අදිකාරිමුල්ල පදිංචි රාජපක්ෂ කංකානමලාගේ දොන් තෝමස් රාජපක්ෂ මහතා.
(9) කෙහෙල්ඇල්ල පදිංචි ලොකුබාලසූරිය අප්පුහාමිලාගේ ධර්මසේන මහතා.
(10) කඩවල පදිංචි, හොඳමුනි පබ්ලිස් ද සිල්වා මහතා.
(11) මහහුණුපිටිය පදිංචි, එම්. එෆ්. කොස්තා මහතා.
(12) නෑගෙනහිර කළුවාඉරිප්පුව පදිංචි, ඊ. ජී. අබේසිංහ මහතා.
(13) තොප්පිල්ලගහවත්ත පදිංචි, විමල් සිරිකුමාර මහතා.
(14) කළුවාඉරිප්පුව පදිංචි එම්. පී. කුරේ මහතා.
(15) බටහිර කළුවාඉරිප්පුව පදිංචි අතුකෝරළගේ එඩ්මන් පෙරේරා මහතා.
(16) පල්ලියපිටිය පදිංචි, ජේ. ගුණරත්න මහතා.
(17) පල්ලියපිටිය පදිංචි, එම්. ඩී. කරුණාරත්න මහතා.
(18) පල්ලියපිටිය පදිංචි, එම්. ඩී. එඩ්මන්ඩ් මහතා.
(19) ඌරාපන පදිංචි, කේ. ඒ. පී. අමරසිංහ අප්පුහාමි මහතා.
(20) දළුපත්ගෙදර-වැල්ලවගෙදර පදිංචි එන්. කේ. සව්සේරිස් අප්පුහාමි මහතා.
(21) කොටදෙනියාව, පොල්හේන රජයේ වත්තේ පදිංචි ලියනගේ දොන් සව්සේරිස් අප්පුහාමි මහතා.
(22) හේන්පිටගෙදර පදිංචි, එන්. සකලසූරිය මහතා.
(23) කොටදෙනියාව, වරාදොල පදිංචි එස්. ඒ. කරුණානායක මහතා.
(24) කොටදෙනියාව, හීරළුගෙදර පදිංචි ඇලඩින් රාජපක්ෂ මහතා.
(25) හුණුමුල්ල පදිංචි, අබේසිංහ කළුආරච්චිගේ දොන් විලියම් පෙරේරා අබේසිංහ මහතා.
(26) හුණුමුල්ල පදිංචි, බොදියාවෙරළගේ පියදාස මහතා.
(27) දාගොන්න පදිංචි, ඒ. ඩී. පේදුරු මහතා.

(ආ) ඉහතකී මණ්ඩලයේ සභාපති වශයෙන් බටහිර කළුවාඉරිප්පුවේ පදිංචි, සැම් විල්ප්‍රඩ් ඇලෝසියස් සෙනෙවිරත්න මහතා පත් කරමි ; තවද,

(ඇ) එබඳු එක් එක් සාමාජිකයා නිලය දැරිය යුතු කාලසීමාව, මේ ආඥාව ගැසට් පත්‍රයෙහි පළකරනු ලබන දින සිට අවුරුදු 2 ක් විය යුතු යයි නිශ්චය කරමි.

සැම් පී. සී. ප්‍රනාන්දු,
අධිකරණ අමාත්‍ය.

1962 ඔක්තෝබර් මස 11 වැනි දින.
කොළඹ දීය.

10-795

---

## බන්ධනාගාර ආඥා පණත

වර්ෂ 1939 අංක 53 දරණ ආඥා පණතින් සංශෝධනය කොට වර්ෂ 1947 සැප්තැම්බර් 24 වැනි දින අංක 9773 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද ප්‍රකාශයෙන් වෙනස් කර ඇති (44 වැනි පරිච්ඡේදය වන) බන්ධනාගාර ආඥා පණතේ 32 (I) (ආ) දරණ වගන්තියේ ප්‍රකාර, මෙහි උප ලේඛනයේ II වැනි තීරයේ සඳහන් තැනැත්තන්, මෙම දැන්වීමේ සඳහන් දින සිට තුන් අවුරුදු කාලය කට, උපලේඛනයේ I වැනි තීරයේ සඳහන් ආයතනයේ ප්‍රාදේශීය සෝදිසි කොමිටියේ සාමාජිකයන් වශයෙන්, කර්මාන්ත, සවදේශ හා සංස්කෘතික කටයුතු භාර ගරු ඇමතිවරයා විසින් පත් කොට තිබේ.

වී. එල්. වීරසිංහ,
කර්මාන්ත, සවදේශ සහ සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1962 ඔක්තෝබර් මස 10 වැනි දින,
කොළඹ 7,
කර්මාන්ත, සවදේශ හා සංස්කෘතික කටයුතු භාර අමාත්‍යාංශය.

### උපලේඛනය

| I | II |
| --- | --- |
| අළුත්කඩේ බන්ධනාගාරය | එච්. ජී. ඇරුව්වාවල මහතා. |

10-635

---

## දැන්වීමයි

ගාලුවත අධිකරණ කොට්ඨාශය ඇතුළත ඉංග්‍රීසි සහ සිංහල භාෂා වන්ගෙන් නොතාරිස් ධුරයේ කටයුතු කිරීමට බලය ලත් සිරිල් ගෝඩන් ලීන්ස්කි ද අල්විස් මහතා විසින් නොතාරිස් වරුන් පිළිබඳ (පරිච්ඡේද අංක 107 දරණ) ආඥා පණතේ 22 (I) වගන්තිය යටතේ 1962ක් වූ ජූනි මස 18 වැනි දින සිට නොතාරිස් ධුරයෙන් ඉල්ලා අස්වීමේ ලියකියවිලි ඉදිරිපත් කරන ලද්දුව, කර්මාන්ත, සවදේශ සහ සංස්කෘතික කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා විසින් එකී දින සිට, එම ඉල්ලා අස්වීම භාරගෙන තිබේ.

වී. එල්. වීරසිංහ,
කර්මාන්ත, සවදේශ සහ සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1962ක් වූ ඔක්තෝබර් මස 2 වැනි දින,
කොළඹ දීය.

10-618

## රජයේ ඉඩම් ආඥා පනත

රජයේ ඉඩම් ආඥා පණතේ (454 වෙනි පරිච්ඡේදය) 95 සහ 96 වැනි ඡෙද යටතේ තමා වෙත පැවරී ඇති බලතල හේතුකොට කෘෂිකම්, ඉඩම්, වාරිමාර්ග හා විදුලි බලය පිළිබඳ ගරු ඇමති තුමා විසින් පනවා සෙනෙට් මන්ත්‍රී මණ්ඩලය හා නියෝජිත මන්ත්‍රී මණ්ඩලය විසින් අනුමත කරන ලද රෙගුලාසිය.

සී. පී. ද සිල්වා,
කෘෂිකම්, ඉඩම්, වාරිමාර්ග හා විදුලි බල ඇමති.

1962 ඔක්තෝබර් මස 11 දින,
කොළඹ දී ය.

### රෙගුලාසිය

1948 ඔක්තෝබර් 15 දින අංක 9,912 දරණ ගැසට් පත්‍රයේ පළවූ, 1948 රජයේ ඉඩම් රෙගුලාසි පහත දැක්වෙන ආකාරයෙන් සංශෝධනය කර තිබේ.

1. 7 වැනි රෙගුලාසියෙහි (බී) ඡෙදය වෙනුවට පහත දැක්වෙන අළුත් ඡෙදය එකතු කිරීමෙන් :—

   (බී) නිවැරදි කිරීමට හෝ සංශෝධනය කිරීමට ඇති පැවරීමේ නීත්‍යානුකූල ලේඛනය දුම්රිය සාමාන්‍යාධිකාරි විසින් හෝ දුම්රිය දෙපාර්තමේන්තුවේ ඉඩම් නිලධාරියා විසින් ක්‍රියාවේ යොදවා ඇති විටක එකී දුම්රිය සාමාන්‍යාධිකාරී විසින් හෝ එකී ඉඩම් නිලධාරි තැන විසින් එම නීත්‍යානුකූල ලේඛනය නිවැරදි කිරීම හෝ සංශෝධනය කිරීම කළ හැක, නැතහොත් ; සහ

2. එහිම දෙවෙනි උප ලේඛනයෙහි 1 වෙනි තීරුවෙහි 5 වෙනි විෂයේ "දුම්රිය සාමාන්‍යාධිකාරී" යන වචන වෙනුවට "දුම්රිය සාමාන්‍යාධිකාරී හෝ දුම්රිය දෙපාර්තමේන්තුවේ ඉඩම් නිලධාරි තැන" යන වචන එකතු කිරීමෙන්.

10-767

---

## 1953 අංක 36 දරණ රබර් නැවත වගා කිරීමට ආධාර දීමේ පනත

### නිවේදනයයි

1953 අංක 36 දරණ රබර් නැවත වගා කිරීමට ආධාර දීමේ පනතේ 10 වෙනි ඡෙදය යටතේ ගරු කෘෂිකම්, ඉඩම්, වාරිමාර්ග හා විදුලි බලය පිළිබඳ ඇමති තුමා විසින් පහත නම් සඳහන් මහතුන්) රබර් නැවත වගා කිරීමේ උපදෙශක මණ්ඩලයේ සාමාජිකයින් වශයෙන් 1962 ඔක්තෝබර් මස 9 වැනි දින සිට අවුරුදු තුනක කාලයකට පත් කර ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

1. රබර් පාලක (නිල බලයෙන් සභාපති)
2. ආචාර්ය, ඊ. ඩී. සී. බැප්ටිස්ට්
3. එස්. පද්මනාදන් මහතා
4. ඩබ්ලිව්. එම්. තොම්සන් මහතා
5. ඩබ්ලිව්. පී. එච්. ඩයස් මහතා
6. උපාලි ඩයස් මහතා

කෘෂිකම්, ඉඩම්, වාරිමාර්ග හා විදුලි
බල අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1962 ඔක්තෝබර් මස 9 දින,
කොළඹ දී ය.

10-542

---

## 1957 තේ 48 වෙනි අංකය දරණ මෝටර් ගමනාගමන පනත

### 20 (1) වෙනි වගන්තිය යටතේ කරන නියෝගය

කම්කරුවන් හා ජනසතු සේවාවන් පිළිබඳ අමාත්‍ය ධුරන්ධර මයිකල් පෝල් ද සොයිසා සිරිවර්ධන වන මම 1961 කේ 22 වෙනි අංකය දරණ මෝටර් ගමනාගමන (සංශෝධන) පණතෙන් සංශෝධිත 1957 තේ 48 වෙනි අංකය දරණ මෝටර් ගමනාගමන පණතේ 20 (1) වෙනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල පිට, මෙහි පහත පෙනේන උප ලේඛනයෙහි විස්තර දක්වා ඇති නිශ්චල දේපළ 1962 ඔක්තෝබර් මස 19 වෙනි දින සිට මේ නියෝගය අනුව ලංකා ගමනාගමන මණ්ඩලය වෙත පවරමි.

ඇම්. පී. ද ඉසැඩ් සිරිවර්ධන,
කම්කරුවන් හා ජනසතු සේවා පිළිබඳ අමාත්‍ය තැන.

1962 ඔක්තෝබර් මස 12 වෙනිදින.
කොළඹදීය.

### උප ලේඛනය

| දේපළ | පිහිටීම හා සෙසු විස්තර |
|---|---|
| 1. සීමා සහිත ඇල්පිටිය මෝටර් වරාන් සිට් සමාගම විසින් පාවිච්චි කළ දේපළ. "ද සිල්වා" ගොඩනැගිල්ල පිහිටියා වූද, ඊට අයිති වූද ගීන්පන්විල අද්දර දෙණිය නමින් ව්‍යවහාර වන්නාවූද, හැඳින් වෙන්නා වූද, පර්චස් 14.90ක ප්‍රමාණයේ මුළු ඉඩම. | ගාලු දිස්ත්‍රික්කයේ ඉගල නම් ගමේ උතුරට, නැගෙනහිරට හා බස්නාහිරට : එම ඉඩමේ කොටසය ; දකුණට : ර. වැ. දෙ. පාරය යන මේ මායිම් තුළ පිහිටා තිබේ. මෙය බලයලත් මිනින්දෝරු කෙනෙකු වන ඒ. ගණේගොඩ මහතා විසින් සකස් කරන ලද 1242 වෙනි මිනුම් සැලැස්මෙහි දක්වා ඇත. (1960 ඔක්තෝබර මස 5 වෙනි දා මනින ලදී) |
| 2. සීමා සහිත මධ්‍යම ලංකා බස් රථ සමාගම විසින් පාවිච්චි කරනලද දේපළ. බස් සමාගම විසින් පාවිච්චි කරන ලද ගොඩනැගිල්ලේ කොටස පිහිටා ඇත්තාවූද ඊට අයිති වූද. පර්චස් 6.43 ප්‍රමාණයේ මුළු ඉඩම. | හැටන්-දික්ඔය නගර සභා සීමාවන් තුළ හැටන් දික්ඔය පාරේ 47 වෙනි වරිපනම් අංකය දරණ ස්ථානය. උතුරට : ඇම්. ආර්. ප්‍රනාන්දු සහ සමාගමට අයිති 45 වෙනි වරිපනම් අංකය දරණ ඉඩමය ; නැගෙනහිරට : ආර්. ද පොන්සේකා මහත්මියට අයිති 49/1 වෙනි වරිපනම් අංකය දරණ ඉඩමය ; දකුණට : 49 වෙනි වරිපනම් අංකය දරණ "ශ්‍රී පාද" සිනමා හලය ; බස්නාහිරට : ර. වැ. දෙ. පාරය යන් මේ මායිම් තුල පිහිටා තිබේ. මෙය බලය ලත් මිනින්දෝරු කෙනෙකු වන බෙන් සමරසිංහ මහතා විසින් සකස් කරන ලද 462 වෙනි මිනුම් සැලැස්මෙහි දක්වා ඇත. (1959 ඔක්තෝබර් 4 වෙනි දා මනින ලදී.) |
| 3. සීමා සහිත පානදුර මෝටර් වරාන් සිට් සමාගම විසින් පාවිච්චි කරන ලද දේපළ. | |
| (ඒ) ගොඩනැගිල්ලක් පිහිටියාවූද ඊට අයිතිවූද ගඟ අද්දර වත්ත නමින් ව්‍යවහාර වන්නාවූද, හැඳින් වෙන්නාවූද, පර්චස් 5.1 ක ප්‍රමාණයේ මුළු ඉඩම. | රත්නපුරයේ, නගර සභා සීමාවන් තුළ රත්නපුරයේ රිවර්සයිඩ් පාරේ 8 වෙනි වරිපනම් අංකය දරණ ස්ථානය. උතුරට : රිවර්සයිඩ් පාරේ 6 වෙනි වරිපනම් අංකය දරණ ඉඩමය ; නැගෙනහිරට : රිවර්සයිඩ් පාර ය ; දකුණට : රිවර්සයිඩ් පාරේ 10 වෙනි වරිපනම් අංකය දරණ ඉඩමය ; බස්නාහිරට : කළු ගඟය ; යන මේ මායිම් තුල පිහිටා තිබේ. මෙය 698 වෙනි අංකය හා 1959 දෙසැම්බර් මස 1 වෙනි දිනය දරන්නාවූද බලයලත් මිනින්දෝරු කෙනෙකු වන ඩී. ඩබ්ලිව්. ගුණරත්න මහතා විසින් සකස් කරන ලද්දාවූද මිනුම් සැලැස්මෙහි දක්වා ඇත. |
| (බී) ස්ථිර මඩුවක් හා රැම්පයක් පිහිටියාවූද ඊට අයිතිවූද ගඟ අද්දරවත්ත නමින් ව්‍යවහාර වන්නාවූද හැඳින්වෙන්නාවූ ද පර්චස් 22 ක ප්‍රමාණයේ මුළු ඉඩම. | රත්නපුරයේ නගර සභා සීමාවන් තුළ ; උතුරට : රිවර්සයිඩ් පාරේ 16 වෙනි වරිපනම් අංකය දරණ ඉඩමය ; නැගෙනහිරට : රිවර්සයිඩ් පාරය ; දකුණට : බෝ මළුවය (නගර සභා ඉඩම) ; බස්නාහිරට : කළු ගඟය යන මේ මායිම් තුළ පිහිටා තිබේ. මෙය 793 වෙනි අංකය හා 1960 සැප්තැම්බර් මස 12 වෙනි දිනය දරන්නාවූද බලය ලත් මිනින්දෝරු කෙනෙකු වන ඩී. ඩබ්ලිව්. ගුණරත්න මහතා විසින් සකස් කරන ලද්දාවූද මිනුම් සැලැස්මෙහි දක්වා ඇත. |

| දේපළ | පිහිටීම හා සෙසු විස්තර |
| --- | --- |
| **4. සීමාසහිත සිල්වර් ලයින් බස් රථ සමාගම විසින් පාවිච්චි කරන ලද දේපළ.** කාර්යාල ගොඩනැගිලි ලක් පිහිටා ඇත්තාවූද ඊට අයිතිවූද පර්චස් 17.85 ප්‍රමාණයේ මුළු ඉඩම. | මහනුවර නාගරික සභා සීමාවන් තුළ පිහිටියාවූද මහනුවර-කටුගස්තොට පාරේ 333 වෙනි (පරණ අංක 235/1) වරිපනම් අංකය දරණ ස්ථානය, 1088 වෙනි අංකය හා 1960 සැප්තැම්බර් මස 8 වෙනි දිනය දරන්නාවූද බලයලත් මිනින්දෝරු කෙනෙකු වන ඇල්. බී. බැද්දෙවෙල මහතා විසින් සකස් කරන ලද්දාවූද මිනුම් සැලැස්මෙහි දක්වා ඇත. |
| **5. සීමා සහිත ඌව බස් රථ සමාගම විසින් පාවිච්චි කරන ලද දේපළ.** ගොඩනැගිල්ලක් පිහිටි යාවූද ඊට අයිතිවූද පණ්ඩිතගෙදරවත්ත හා රදළ වත්ත යන නම් ව්‍යවහාර වන්නාවූද එසේ හැඳින් වෙන්නාවූද රූඩ් 1 පර්චස් 22.2 ප්‍රමාණයේ මුළු ඉඩම. | බදුල්ල නගර සභා සීමාවන් තුළ බදුල්ලේ ලේ පේවගේ පටුමගේ 9 වෙනි වරිපනම් අංකය දරණ ස්ථානය. උතුරට : නගර සභා වෙළ දාම් පොළය ; නැගෙනහිරට : රදළ වත්ත නම් ඉඩම ය ; දකුණට : නැපැල් පොළ පාර ය ; බස්නාහිරට: පේවගේ පටුමග හා පේවගේ පටු මගෙහි 11 වෙනි වරිපනම් අංකය දරණ ඉඩමය යන මේ මායිම් තුළ පිහිටා තිබේ. මෙය 1794 වෙනි අංකය දරන්නාවූද බලයලත් මිනුම් දෝරු කෙනෙකු වන ඩබ්ලිව්. බී. ඩබ්ලිව්. වෙල්ගොල්ල මහතා විසින් සකස් කරන ලද්දාවූද මිනුම් සැලැස්මෙහි දක්වා ඇත. (1959 යේ සැප්තැම්බර මස 8 වෙනි දින මනින ලදි.) |

10-725

---

## පඩි පාලක සභා ආඥාපනත

### නිවේදනයයි

පඩිපාලක සභා ආඥාපනතේ (136 වෙනි අධිකාරය) 9 වන වගන්තිය යටතේ ගරු කම්කරු හා ජනසතු සේවා ඇමතිතුමන් විසින් පහත සඳහන් පත්කිරීම් කරන ලද බව පඩිපාලක සභා ව්‍යවස්ථා සංග්‍රහයේ 26 වන ව්‍යවස්ථාව යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ :—

1. අයිස් හා සිසිල්බීම නිපදවීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාවේ සාමාජිකයෙකුව සිට, පඩිපාලක සභා ආඥාපනතේ 12 (2) වගන්තිය යටතේ ඉල්ලා අස්වූවා සේ සැලකෙන ඩබ්ලිව්. ඇම්. ඇම්. ආරියසේන සිල්වා මහතා වෙනුවට එම පඩිපාලක සභාවේ සේව්‍ය නියෝජිත සාමාජිකයකු වශයෙන් පෙනී සිටීමට ඈූප්. ඇස්. කන්දප්පා මහතා ;

2. එම කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාවේ සාමාජිකයෙකුව සිට පඩිපාලක සභා ආඥාපනතේ 12 (2) වගන්තිය යටතේ ඉල්ලා අස්වූවා සේ සැලකෙන කේ. ත්‍යාගරාජා මහතා වෙනුවට එම පඩිපාලක සභාවේ සේව්‍ය නියෝජිත සාමාජිකයකු වශයෙන් පෙනී සිටීමට, සී. පී. වීරසිංහ මහතා ; සහ

3. එම කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාවේ සාමාජිකයෙකුව සිට ඉල්ලා අස්වූ කේ. වී. ගුණසේන මහතා වෙනුවට එම පඩිපාලක සභාවේ සේව්‍ය නියෝජිතයෙකු ලෙස පෙනී සිටීමට කේ. කේ. ඒ. රණවීර මහතා.

වී. ඇස්. ඇම්. ද මැල්,
සථිර ලේකම්වරයා,
කම්කරු හා ජනසතු සේවා අමාත්‍යාංශය.

1962 ඔක්තෝබර් මස 11 වැනි දින,
කොළඹ දීය.

10-688

---

## පඩිපාලක සභා ආඥාපනත

පඩිපාලක සභා ආඥාපනතේ (136 වන අධිකාරයේ) 9 වන වගන්තිය යටතේ ගරු කම්කරු හා ජනසතුසේවා පිළිබඳ ඇමතිතුමන් විසින් අයිස් හා සිසිල්බීම නිපදවීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාවේ සේව්‍ය නියෝජිත සාමාජිකයකු වූ ඇස්. සී. රූම් මහතා දිවයිනෙන් බැහැරව සිටි කාලය තුළ ඔහු වෙනුවෙන් වැඩ බැලීමට පත් කරනු ලැබ සිටි බී. මැක්විකර් මහතාගේ පත්වීම රූම් මහතා ආපසු පැමිණ එම පඩිපාලක සභාවේ සේව්‍ය නියෝජිත සාමාජිකයෙකු වශයෙන් යළි වැඩ බාරගත් 1962 සැප්තැම්බර් මස 1 වන දින පටන් අවසාන වූ බව, මෙයින් නිවේදනය කරනු ලැබේ.

වී. ඇස්. ඇම්. ද මැල්,
සථිර ලේකම්වරයා,
කම්කරු හා ජනසතු සේවා පිළිබඳ අමාත්‍යාංශය.

1962 ඔක්තෝබර් මස 11 වැනි දින,
කොළඹ.

10-706

---

## පඩිපාලක සභා ආඥාපනත

(136 වන අධිකාරය වන) පඩිපාලක සභා ආඥාපනතේ 8 වන වගන්තිය යටතේ පිහිටුවන ලද නූල් කැටීමේ, රෙදිවිවීමේ සහ (මේස් බැනියම් ආදී භාණ්ඩ සෑදීම ඇතුළු) ඇඳුම් සෑදීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාවේ ලේකම්වරයා වශයෙන් නැවත නියෝග කරන තුරු කටයුතු කිරීමට කම්කරු හා ජනසතු සේවා ගරු ඇමතිතුමන් විසින්, සී. ජේ. වීරසේකර මහතා පත් කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

වී. ඇස්. ඇම්. ද මෙල්,
කම්කරු හා ජනසතු සේවා අමාත්‍යාංශයේ
සථිර ලේකම්වරයා.

1962 ඔක්තෝබර් මස 12 වැනි දින,
කොළඹ දීය.

10-816

---

## 1961 අංක 29 දරණ මහජන බැංකු පනත

**24 (1) වන වගන්තිය යටතේ නිකුත් කරනු ලැබෙන නියෝගය**

වාණිජ, වෙළෙඳ, ආහාර හා නැව් පිළිබඳ වැඩබලන ඇමති නැන්පත් දොන් සැමුවෙල් ගුණසේකර වන මම, 1961 අංක 29 දරණ මහජන බැංකු පනතේ 24 වෙනි වගන්තියේ (1) වෙනි උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, 1962 ඔක්තෝබර් මස පළමුවෙනි දින සිට සීමාසහිත හලාවත ප්‍රාදේශීය සමූපකාර බැංකුව විසුරුවා හරිනු ලබන බවත්, එකී බැංකුවේ වත්කම් හා බැරකම් මහජන බැංකුවේ වත්කම් හා බැරකම් බවට පත්වනු ලබන බවත් මෙයින් ප්‍රකාශ කරමි.

ඩී. ඇස්. ගුණසේකර,
වැඩබලන වාණිජ, වෙළෙඳ, ආහාර හා නැව් ඇමැති.

1962 සැප්තැම්බර් 30 දින,
කොළඹ දීය.

10-540

# ආදයම් හා වියදම් පිළිබඳ වාර්තා

## රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල—30/9/60 දිනට දැක්වෙන අයවැය පත්‍රය

**ණය**

| | රු. ශ. |
|---|---|
| දයක මුදල් ගිණුම : අනිවාර්ය ... | 1,46,86,422 87 |
| දයක මුදල් ගිණුම : ස්වේච්ඡා ... | 3,33,342 57 |
| රජයේ ප්‍රසාද මුදල | 2,03,67,767 54 |
| 1959/60 ආදයම් වර්ෂයේ ආයතන වියදම—රජයේ ගිණුම | 1,39,518 29 |
| ආදයම් වෙන් කිරීමේ ගිණුම ... | 57,019 38 |
| | 65 |

**අය**

| ආයෝජන විස්තර | වර්ෂය | මතුපිට වටිනාකම රු. ශ. | වෙළඳ මිල රු. ශ. | ගත් මිල රු. ශ. |
|---|---|---|---|---|
| 3½% සවදේශ ආරක්ෂා ණය මුදල ... | 62/67 | 1,18,700 0 | 1,20,332 12 | 1,15,700 0 |
| 3½% සවදේශ ආරක්ෂා ණය මුදල ... | 63/67 | 3,52,800 0 | 3,60,297 0 | 3,61,550 0 |
| 3½% ජාතික ණය මුදල ... | 64/69 | 7,68,000 0 | 7,90,080 0 | 7,39,948 75 |
| 3% ජාතික සංවර්ධන ණය මුදල ... | 65/70 | 20,40,500 0 | 20,46,876 56 | 20,04,140 50 |
| 2½% ජාතික සංවර්ධන ණය මුදල ... | 67/72 | 20,00,000 0 | 18,96,250 0 | 20,00,000 0 |
| 3% ශ්‍රී ලංකා ණය මුදල ... | 69/74 | 12,50,000 0 | 12,37,500 0 | 12,50,000 0 |
| 3% ලංකා රජයේ ණය මුදල ... | 66/71 | 10,00,000 0 | 10,01,875 0 | 10,00,000 0 |
| 3% ලංකා රජයේ ණය මුදල ... | 72/77 | 15,00,000 0 | 14,37,187 50 | 15,00,000 0 |
| 3% ලංකා රජයේ ණය මුදල ... | 73/77 | 12,50,000 0 | 11,89,843 75 | 12,50,000 0 |
| 3½% ලංකා රජයේ ණය මුදල ... | 59/61 | 12,50,000 0 | 12,55,468 75 | 12,37,500 0 |
| 3% ජයග්‍රාහක ණය මුදල ... | 65/70 | 1,00,000 0 | 1,00,437 50 | 90,000 0 |
| 3½% ලංකා රජයේ ණය මුදල ... | 59/64 | 1,05,000 0 | 1,05,459 37 | 1,02,637 50 |
| 3¼% ලංකා රජයේ ණය මුදල ... | 1964 | 5,00,000 0 | 5,09,687 50 | 5,00,000 0 |
| 3¼% ජාතික නිවාස ණයකරය ... | 70/72 | 10,00,000 0 | 10,26,250 0 | 10,00,000 0 |
| 2½% ලංකා රජයේ ණය මුදල ... | 60/62 | 12,50,000 0 | 12,49,218 75 | 12,50,000 0 |
| 3¼% ලංකා රජයේ ණය මුදල ... | 75/80 | 10,00,000 0 | 9,61,250 0 | 10,00,000 0 |
| 3% ජාතික නිවාස ණයකරය ... | 69/71 | 10,00,000 0 | 10,02,500 0 | 10,00,000 0 |
| 3¼% ලංකා රජයේ ණය මුදල ... | 76/81 | 10,00,000 0 | 9,59,375 0 | 10,00,000 0 |
| 3% ලංකා රජයේ ණය මුදල ... | 69/72 | 20,00,000 0 | 19,97,500 0 | 20,00,000 0 |
| 3¼% ලංකා රජයේ ණය මුදල ... | 73/77 | 15,00,000 0 | 14,85,937 50 | 15,00,000 0 |
| 3¼% ලංකා රජයේ ණය මුදල ... | 75/79 | 20,00,000 0 | 19,62,500 0 | 20,00,000 0 |
| 3¼% ලංකා රජයේ ණය මුදල "බී" ... | 75/79 | 20,00,000 0 | 19,56,250 0 | 20,00,000 0 |
| 3½% ලංකා රජයේ ණය මුදල ... | 76/80 | 40,00,000 0 | 40,17,500 0 | 40,00,000 0 |
| | | 2,89,85,000 0 | 2,86,69,576 30 | 2,89,01,476 75 |
| ලංකා සේවිංස් බැංකුව (පාස් පොත් අංකය : 185075) ... | | | | 15,995 34 |
| අවිනිශ්චිත ගිණුම ... | | | | 1,849 64 |
| භාණ්ඩාගාරයේ 2½% පොලිය සහිත තැන්පත් මුදලේ තාවකාලික ආයෝජන ... | | | | 10,00,000 0 |
| භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් ළඟ තිබෙන මුදල ... | | | | 56,64,748 92 |
| | | | | 3,55,84,070 65 |

### 1960 සැප්තැම්බර් මස 30 වැනි දිනෙන් කෙළවරවූ ආදයම් වර්ෂයේ ලැබීම් හා ගෙවීම් දක්වෙන වාර්තාව

**ලැබීම්**

| | රු. ශ. | රු. ශ. |
|---|---|---|
| 1/10/59 වන දිනට භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් තැන ළඟ තිබෙන ඉතිරි මුදල ... | | 61,22,848 62 |
| දයක මුදල් (අනිවාර්ය)... | 33,53,270 87 | |
| දයක මුදල් (ස්වේච්ඡා) ... | 61,852 43 | |
| | | 34,15,123 30 |
| රජයේ ප්‍රසාද මුදල් ගණනය : | | |
| (අ) අනිවාර්ය දයක මුදල් ... | 46,14,398 0 | |
| (ආ) ආරක්ෂණ වාර මුදල් ... | 3,593 95 | |
| | | 46,17,991 95 |
| අයෝජනවල පොලිය : | | |
| (අ) ලංකා රජයේ ණය මුදල් ... | 7,68,327 29 | |
| (ආ) ලංකා සේවිංස් බැංකුවේ දැක්වෙන මුදල් ... | 390 12 | |
| | | 7,68,717 41 |
| අවිනිශ්චිත ගිණුම ... | | 10,01,812 51 |
| | | 1,59,26,493 79 |

**ගෙවීම්**

| | රු. ශ. | රු. ශ. |
|---|---|---|
| ධන යෙදීම : | | |
| (අ) ලංකා රජයේ ණය මුදල් ... | 40,00,000 0 | |
| (ආ) ලංකා සේවිංස් බැංකුවේ දක්වෙන මුදල ... | 390 12 | |
| (ඇ) මහා භාණ්ඩාගාරයට තාවකාලික ණය ... | 10,00,000 0 | |
| | | 50,00,390 12 |
| ප්‍රදනයන් ගෙවීමේ ගිණුම : | | |
| (අ) අනිවාර්ය දයක මුදල ... | 16,06,246 70 | |
| (ආ) ස්වේච්ඡා දයක මුදල ... | 1,20,428 36 | |
| (ඇ) රජයේ ප්‍රසාද මුදල් ... | 24,17,631 27 | |
| | | 41,44,306 33 |
| ආයතන වියදම 1958/59... ... | | 1,44,951 55 |
| අවිනිශ්චිත ගිණුම ... | | 10,02,096 87 |
| ඉතිරි මුදල ... | | 56,64,748 92 |
| | | 1,59,26,493 79 |

### ආදයම් වෙන්කිරීමේ ගිණුම

| | රු. ශ. |
|---|---|
| අනිවාර්ය දයක මුදල් (ගැලපීම් ජ.ස. 53) ... | 0 2 |
| රජයේ ප්‍රසාද මුදල් (ගැලපීම් ජ. ස. 54) ... | 0 36 |
| ගිණුම් සඳහා පොලිය : | |
| අනිවාර්ය දයක මුදල්... ... | 2,63,266 52 |
| ස්වේච්ඡා දයක මුදල්... ... | 6,742 42 |
| රජයේ ප්‍රසාද මුදල් ... | 3,41,244 26 |
| ආයතන වියදම් 1959/60 ... | 1,39,518 29 |
| ආදයම් මුදල් වෙන් කිරීමේ ගිණුමෙන් ඉතිරි මුදල ... | 57,019 38 |
| | 8,07,791 25 |

| | රු. ශ. |
|---|---|
| ඉතිරි මුදල ... | 39,073 84 |
| පොලී ගිණුමෙන් මාරු කළ මුදල් ... | 7,68,717 41 |
| | 8,07,791 25 |

බී. වී. ජෝර්ජ්,
රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලේ පාලන මණ්ඩලයේ ලේකම්.

සී. බාලසිංහම්,
භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් හා
රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලේ සභාපති.

කොළඹ, අප්‍රේල් 11, 1961.

10–668

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## අංක 44/62 දරන ආනයන පාලන දැන්වීම

ආනයන

කවර මාර්ගයකින් නමුදු ආනයනය කරනු ලබන (මෙම දැන්වීමේ 2 ඡේදයේ සඳහන් ඒවා හැර) සියලු ම බඩු නො පමාව ම බල පත්‍ර යටතට පත් කර තිබෙන වග ආනයනකයින්ටත්, මහ ජනයාටත් මෙයින් දැනුම් දෙනු ලැබේ. සාමාන්‍ය ආනයන බලපත්‍ර, සාමාන්‍ය ආනයන (ආහාර ද්‍රව්‍ය) බලපත්‍ර හෝ සාමාන්‍ය ආනයන (රෙදි පිළි) බලපත්‍ර යටතේ මේ දක්වා වූ ආනයනවලට මෙය බල පැවැත් වේ.

2. පහත දක්වෙන අංක විවෘත සාමාන්‍ය බල පත්‍ර යටතේ තව දුරටත් ආනයනය කළ හැක :—

(i) ආහාර ද්‍රව්‍ය
(ii) පැට්‍රෝල්
(iii) ඉන්ධන
(iv) පෝර
(v) සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ලංකා ආරෝග්‍ය ශාලා සූත්‍ර සංග්‍රහයේ ඖෂධ.

3. දැනට ආනයන පාලනය යටතට පත් කර තිබෙන බඩු සඳහා වූ ඉතිරිව ඇති යම් ඇණවුමක් එල්ලේ නෞකා ගත කිරීම් 1962 ඔක්තෝබර 10 පසුව මෙම පාලනයේ ප්‍රකාශිත අවසරයක් නොමැති ව ක්‍රියාවේ නො යෙදවිය යුතු ය.

4. 1962 ඔක්තෝබර 10 ද හෝ ඊට පෙර හෝ විවෘත සාමාන්‍ය බලපත්‍ර යටතේ නෞකා ගත කළ සියලු ම බඩු වෙසෙසූ ආනයන බල පත්‍ර නොමැති ව ඉවත් කර ගැනීම පිණිස අවසර දීමට රේගුවේ ප්‍රධාන අයකැමි හට බලය පවරා ඇත.

සී. මයිල්වාගනම්,
ආනයන සහ අපනයන පාලක.

1962 ඔක්තෝබර 10 දින,
කොළඹ 3.

10-817/1

---

## අංක 45/62 දරන ආනයන පාලන දැන්වීම්

ආනයන

1962 ඔක්තෝබර් 10 දින හෝ ඊට පෙර විවෘත කරන්ට යෙදුනා වූද එම දිනයට පසුව සිදුවෙන නෞකාගත කිරීම්වලට වලංගු වූද අවලංගු කළ නොහැකි ණයවර ලිපිවලින් ආවරණය කරන ලද බඩු සඳහා ඉතිරිව තිබෙන ඇණවුම් සම්බන්ධයෙන් ආනයන බලපත්‍රයක් බලය නොමැතිව (වෙසේසන ලද වලංගු කාල සීමාව ඇතුළතදී) එම ණයවර ලිපි එල්ලේ නෞකාගත කිරීම් ක්‍රියාවේ යෙදිය හැකි බව 1962 ඔක්තෝබර් 10 දින අංක 13,342 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද අංක 44/62 දරන ආනයන පාලන දැන්වීමට ම තවදුරටත් ආනයනකයින් හට මෙයින් දන්වනු ලැබේ.

2. ඒ කෙසේ වුවද, පූර්වෝක්ත පදනම මත ආනයනය කළ බඩු රේගුවෙන් ඉවත් කර ගැනීම සඳහා පහත දක්වෙන ක්‍රියා මාර්ගය ගිණිය යුතු වන්නේ ය :—

(ඒ) මෙම කාර්‍යාලයේ පාවිච්චිය පිණිස; රේගු-සටහනේ අතිරේක පිටපතක් ආනයන ලේඛන සහ රේගුවේ සටහනුත් සමග, පිටසන් කිරීම සඳහා මෙම පාලනයේදී ඉදිරිපත් කළ යුතුය.

(බී) 1962 ඔක්තෝබර් 10 දින ඉතිරිව තිබුණු ණයවර ලිපිය යටතේ වූ ශේෂය දක්වෙන ණයවර ලිපියේ බැංකු සහතික පිටපතක් ද මෙම පාලනයට ඉදිරිපත් කළ යුතුය. මෙම ණයවර ලිපි පිටපත තවදුරටත් ඉතිරිව තිබෙන යම් නෞකාගත කිරීමකට බලය පැවරීම සඳහා මෙම කාර්‍යාලයේ රඳවා ගනු ලැබේ.

3. අවලංගු කළ නොහැකි ණයවර ලිපි මගින් ආවරණය නොකරන ලද ඉතිරිව තිබෙන අනිකුදු ඇණවුම් සම්බන්ධයෙන් පසුවට තවත් නිවේදනයක් ප්‍රසිද්ධ කරනු ලැබේ.

4. පුද්ගලික ආනයන බලපත්‍ර නොමැතිව ආනයනය කිරීමට අවසර ඇත්තේ පහත දක්වෙන බඩු පමණක් බව ආනයනකයින් හට සිහිපත් කරවනු ලැබේ.

| ආනයන පාලන වර්ග කිරීමේ අංකය | | භාණ්ඩ විස්තරය |
|---|---|---|
| 1 | ... | ධාන්‍ය : බෝංචි |
| 1 ඒ | ... | ධාන්‍ය : බාර්ලි |
| 1 බී | ... | ධාන්‍ය : කඩල |
| 1 සී | ... | ධාන්‍ය : ඕට්ස් |
| 1 ඊ | ... | ධාන්‍ය : කේසාලි පරිප්පු, දිග පරිප්පු, මසූර්, මසූර් පරිප්පු, කොල්ලු (පියලි කළ හෝ නොකළ) හැර ඇට වර්ග (පල්ස්) |
| 2 සීසී | ... | ඉරිඟු පිටි |
| 2 ඩී | ... | අරලුප්පිටි සහ සව් (තොග වශයෙන්) |
| 2 ඊ | ... | මයියොක්කා පිටි |
| 2 ඇෆ් | ... | ලංකා රේගු ගාස්තු සංග්‍රහයේ 1 වැනි පංතියේ "ඒ" ගණය යටතේ වර්ග කොට ඇති "වෙන තැනක වෙසෙසා නොමැති පිටි ද්‍රව්‍ය" යන ශීර්ෂය යටතට වැටෙන පිටි ද්‍රව්‍ය |
| 2 ජී | ... | නිවුඩු, පරලු, වියලි පෝෂ, පිදුරු, පොල් පුන්නක්කු හැර සත්වාහාර |
| 2 එච් | ... | වියලි පෝෂ, පිදුරු |
| 2 ජේ | ... | නිවුඩු, පරලු |
| 3 | ... | ආසියාවේ හෝ අප්‍රිකාවේ කවර ස්ථානයකින් හෝ නැව් තොටකින් නෞකාගත කරන ලද අලුත් හෝ ශීත කරනු ලැබූ හරක් මස් සහ එළුමස් — අංක 23/62 ආනයන පාලන දැන්වීම බලන්න |
| 3 ඊ | ... | ආසියාවේ හෝ අප්‍රිකාවේ කවර ස්ථානයකින් හෝ නැව් තොටකින් නෞකාගත කරන ලද හරක් මස්, එළුමස් හැර අලුත් හෝ ශීත කරනු ලැබූ හරක් මස්, එළු මස් |
| 3 ඇෆ් | ... | අලුත් හෝ ශීත කරන ලද හරක් මස්, එළුමස් හැර මස් (මීට්) |
| 3 සී | ... | ආහාර පිණිස ඇති කරන පක්ෂීන් සහ දඩයම් සතුන් හැර ආහාරයට ගන්නා සජීව සත්තු |
| 3 ඩී | ... | ආහාර පිණිස ඇති කරන පක්ෂීන් සහ දඩයම් සත්තු, සජීව |
| 3 ඒ | ... | ලංකා රේගු ගාස්තු සංග්‍රහයේ 1 වැනි පන්තියේ "ඊ" ගණය යටතේ වර්ග කොට ඇති "වෙන තැනක වෙසෙසා නොමැති (පිළියෙල කරන ලද) ධාන්‍යාහාර" යන ශීර්ෂය යටතට වැටෙන ධාන්‍යාහාර (පිළියෙල කරන ලද) — පපඩම් (අප්පලම්) හැර |
| 5 ඒ | ... | ක්‍රීම |
| 5 සී | ... | ටින් කළ හෝ ශීත කළ බටර |
| 5 ඇෆ් | ... | සුරක්ෂිත කළ මාලු (හට්ටි මාලු සහ ජාඩි ඇතුළත් නමුදු වේලූ, ලුණු දැමූ, ශීත කළ, උම්බලකඩ සහ ටින්කළ මාලු හැර) |
| 5 අයි | ... | කොත්තමල්ලි |
| 5 කේ | ... | මිරිස් |

| ආනයන පාලන වර්ග කිරීමේ අංකය | | භාණ්ඩ විස්තරය |
|---|---|---|
| 6 ඒ | ... | මාලු, ශීත කළ |
| 6 බී | ... | බිත්තර — අංක 23/61 ආනයන පාලන දැන්වීම බලන්න |
| 7 | ... | මාලු, ටින් කළ |
| 8 බී | ... | පලතුරු, වේලූ යන්ත්‍රානුසාරයෙන් ජලය හින්දූ ඇතුළත්, රේසින් සහ සුල්තානා හැර |
| 9 | ... | බීම පෙරීම පිණිස වූ ධාන්‍ය සහ බීර මල් |
| 10 | ... | කිරි, සුරක්ෂිත කළ (පිටි කිරි හැර) සම්පූර්ණ යොදය, පැණි රස කළ |
| 11 | ... | කිරි, සුරක්ෂිත කළ (පිටි කිරි හැර) සම්පූර්ණ යොදය, පැණි රස නොකළ |
| 12 | ... | කිරි සුරක්ෂිත කළ, සම්පූර්ණ යොදය, පිටි කිරි |
| 12 ඒ | ... | කිරි සුරක්ෂිත කළ (පිටි කිරි ඇතුළත්ව) යොදය ඉවත් කළ |
| 13 | ... | කිරි ආහාර |
| 13 ඒ | ... | පලතුරු වශයෙන් පාවිච්චි කරන තද ගෙඩි (නට්ස්) |
| 14 | ... | තෙල් සහ මේද, ශුද්ධ කළ, කැහැකි, මාලු : කොඩ්ලිවර් තෙල් (සාමාන්‍ය) |
| 14 ඒ | ... | තෙල් සහ මේද, ශුද්ධ කළ, කැහැකි, සත්ව : ලාර්ඩ් |
| 14 සී | ... | තෙල් සහ මේද, ශුද්ධ කළ, කැහැකි, සත්ව : ඩ්රිපිං |
| 14 ඩී | ... | තෙල් සහ මේද, ශුද්ධ කළ, කැහැකි, සත්ව : ගිතෙල් |
| 14 ඊ | ... | තෙල් සහ මේද, ශුද්ධ කළ, කැහැකි, සත්ව (ඩ්රිපිං, ගිතෙල් සහ ලාර්ඩ් හැර) |
| 14 ඇෆ් | ... | තෙල් සහ මේද, ශුද්ධ කළ, කැහැකි, එළවුළු : ගිතෙල් |
| 14 ජී | ... | තෙල් සහ මේද, ශුද්ධ කළ, කැහැකි, එළවුළු (ඔලිව් තෙල් සහ ගිතෙල් හැර) |
| 15 | ... | තෙල් සහ මේද, ශුද්ධ කළ, කැහැකි, මාලු — කොඩ්ලිවර් තෙල් (සාමාන්‍ය) හැර |
| 15 ඊ | ... | කුළු බඩු — කළු ගම්මිරිස් හැර |
| 16 | ... | ඔලිව් තෙල් |
| 16 සී | ... | අර්තාපල් |
| 17 ජී | ... | එළවුළු (අමු, ශීත වැද්දූ සහ ශීත කරනු ලැබූ එළවුළු) |
| 18 | ... | සීනි, ශුද්ධ කළ : ඉන්දියාවේ නිපැදවූ සහ එහි සිට නෞකාගත කළ තල් සුකිරි (විවෘත සාමාන්‍ය බලපත්‍ර අංක I) |
| 20 | ... | සීනි, ශුද්ධ නොකළ — හකුරු හැර |
| 20 සී | ... | සාර — කෝපි, වයින්, විස්කි, රම්, ෂෙරි, පෝට්වයින්, ජින්, බ්‍රැන්ඩි, අරක්කු (මද්‍යසාර සහිත හෝ රහිත) සාර හැර |
| 21 එච් | ... | යීස්ට් |
| 23 | ... | ලංකා රේගු ගාස්තු සංග්‍රහයේ 1 වැනි පන්තියේ "ඊ" ගණය යටතේ වර්ග කොට ඇති "වෙන තැනක වෙසෙසා නොමැති ආහාර සහ බීම" යන ශීර්ෂය යටතට වැටෙන ආහාරෙ සහ බීම — යීස්ට්, සාස්, හාල් නිෂ්පාදන, සාර වර්ග, පලතුරු කොරදියෙල්, පලතුරු යූෂ (සිරප් ඇතුලු) කෝපියෙන් උපුටාගත් ද්‍රව්‍ය සහ සමානව පිළියෙල කළ ද්‍රව්‍ය මීටම ඇතුළත් කෝපි, අයිස් ක්‍රීම්, අයිස් ක්‍රීම කෝන්, බේකරි නිෂ්පාදන (ළදරුවන්ගේ සහ ලෙඩුන්ගේ ආහාර හැර) වැනි සහ අච්චාරු හැර |
| 24 බී | ... | ගල් අඟුරු |
| 28 | ... | ඩීසල් තෙල් |
| 29 | ... | ගිනි උදුන් තෙල් |
| 30 | ... | ගෑස් තෙල් |
| 31 | ... | ඛණිජ තෙල්, මේද සහ ග්‍රීස් වර්ග — ඩීසල් තෙල්, ගිනි උදුන් තෙල්, ගෑස් තෙල්, පට් දුම්මල, පට් අඩුවැඩිය හැර |
| 32 | ... | පොර වර්ග — මාලු (පොර), පුන්නක්කු (පොර) සහ ඉවත ලන (සෝල්ට් පේටට) ඇතුළත්ව |
| 36 ඒ | ... | කෝක් |
| 37 | ... | අයිතිය ප්‍රකාශිත ඉන්ධන |
| 124 | ... | පැට්‍රෝලියම්, ශුද්ධ කළ (භූමි තෙල් සහ මෝටර් ඉස්පිරිතු ඇතුළුව) |
| 124 ඒ | ... | ස්නේහනක තෙල් සහ |
| 112 | ... | සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ලංකා ආරෝග්‍යශාලා සූත්‍ර සංග්‍රහයේ අන්තර්ගත ඖෂධ. |

සී. මයිල්වාගනම්,
ආනයන හා අපනයන පාලක.

1962 ඔක්තෝබර් මස 11 වෙනි දින,
කොළඹ දී ය.

10–817/2

---

## අංක 46/62 දරන ආනයන පාලන දැන්වීම

### ණයවර ලිපි එල්ලේ කෙරෙන ආනයන

1962 ඔක්තෝබර් 11 දින අංක 13,343 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද අංක 45/62 ආනයන පාලන දැන්වීමේ 2 ඡේදයට ම තවදුරටත් ආනයනකයින්ගෙන් ඉල්ලා සිටින්නේ, විවෘත කර ගන්ට යෙදුනාවූ සියලු ණයවර ලිපින් ඒ එල්ලේ ඔවුන් විසින් එහිලා සටහන් කර ඇති ක්‍රියා මාර්ගය පදනම්කොට ගෙන ක්‍රියාවේ යොදනු ලබන නෞකාගත කිරීම් ද ඇතුළත් ප්‍රකාශයක් ඉදිරිපත් කරන ලෙස ය.

ප්‍රකාශයෙහි පහත දක්වෙන විස්තර ඇතුළත් විය යුතුය.

(i) ණයවර ලිපියේ අංකය
(ii) ණයවර ලිපිය විවෘත කර ගත් දිනය
(iii) 62.10.10 වැනි දින ඉතිරිව තිබෙන වටිනාකම
(iv) වෙළඳ ද්‍රව්‍ය
(v) බැංකුවේ නම
(vi) ණයවර ලිපිය අවසන් වීමේ දිනය.

විශේෂ කොදුවක වමත් කොණ මුදුනේ "ණයවර ලිපිය" යන්න සඳහන් කොට ලියා පදිංචි කළ තැපැලෙන් 1962 ඔක්තෝබර් 20 දා පසු නොකර එවිය යුතුය.

සී. මයිල්වාගනම්,
ආනයන හා අපනයන පාලක.

1962 ඔක්තෝබර් මස 12 වෙනි දින,
කොළඹදීය.

10-817/3

## අංක 47/62 දරණ ආනයන පාලන දැන්වීම

### ඉතිරිව තිබෙන ඇණවුම්—ප්‍රාරම්භක සමීක්ෂණය

1962 ඔක්තෝබර 10 දින අංක 44/62 ආනයන පාලන දන්වීම මගින් බලපත්‍ර පාලනය යටතට ගනු ලැබූ ආනයන සම්බන්ධයෙන්, 1962 ඔක්තෝබර 11 දින 45/62 ආනයන පාලන දැන්වීමේ සඳහන් කර තිබෙන කොන්දේසි සහ ක්‍රියා මාර්ගයට අනුරූපව, අවලංගු කළ නොහැකි ණයවර ලිපි මගින් ආවරණය ලැබ ඉතිරිව තිබෙන ඇණවුම් එල්ලේ නෞකා ගත කිරීම් ක්‍රියාවේ යෙදිය හැක.

2. පුද්ගලික ආනයන බලපත්‍ර මගින් ලබා ගත් බලයක් නොමැතිව පොත්, වාර සඟරා, (එක්ස්පෝස් කළ) සිනමා - චිත්‍රපටි නැවත දැන්වීමක් කෙරෙන තුරු රේගුවෙන් ඉවත් කර ගැනීම පිණිස අවසර ලබා දීමට ද කටයුතු සැලැස්වෙන්නේ ය. එහෙයින් මෙම ආනයන අංක සම්බන්ධයෙන් ඉතිරිව තිබෙන ඇණවුම් අනුව නෞකා ගත කිරීම් ක්‍රියාවේ යෙදවිය හැක. මෙකියන ආනයන සම්බන්ධයෙන් ගිණිය යුත්තේ 1962 ඔක්තෝබර 11 දින 45/62 ආනයන පාලන දැන්වීමේ 2 (ඒ) ඡේදයේ සඳහන් කර ඇති රේගුවෙන් බඩු ඉවත් කර ගැනීමේ ක්‍රියා මාර්ගය යි.

3. ඉතිරිව තිබෙන අනික් සියලුම ඇණවුම් (අවලංගු කළ නොහැකි ණයවර ලිපි මගින් ආවරණය නොලත්) වහාම අවලංගු කර ගත යුතුය. එසේ වුවද මේ රටේ උවමනාවල් සපුරාලීම් වස් අත්‍යවශ්‍ය මෙන් ම වහාම අවශ්‍යයයි මෙම පාලනයට සතුටුදායක වන පරිද්දෙන් ඔප්පු කළ හැකි බඩු සඳහා වූ ඇණවුම් සම්බන්ධයෙන් විශේෂ යක් කරනු ලැබේ.

4. එවැනි අත්‍යවශ්‍ය උවමනාවල් සම්බන්ධයෙන් (විදේශීය සැපයුම්කාරයින් විසින් බාර ගැනුණු එසේම වෙළඳ සමාගම් ඇණවුම් මගින් ආවරණය වුණු) පහත දක්වෙන තොරතුරු 1962 නොවැම්බර 10 දා පසු නොවෙනසේ සපයන ලෙස ආනයනකයින්ට නියම වේ.

| ලංකා රේගුවේ වර්ග කිරීම | | | ඉතිරිව තිබෙන ඇණවුම්වල විස්තරය | | | |
|---|---|---|---|---|---|---|
| අංශය සංකේත අංකය | කොට්ඨාශය සංකේත අංකය | වෙළඳ ද්‍රව්‍ය සංකේත අංකය | බඩුවල විස්තරය | ප්‍රමාණය | ආසන්න ර. වා. ගා වටිනාකම රුපියල් වලින් | නෞකා ගත කිරීම අපේක්ෂිත දිනය |

5. තම තමන්ගේ ප්‍රකාශ "ආ. පා. දැන්වීම් 47" වශයෙන් සලකුණු කොට ලියාපදිංචි තැපැලෙන් මෙම කාර්යාලයට ඉදිරිපත් කරන් ලෙස ආනයනකයින්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ.

6. ඉහත 4 ඡේදයේ සඳහන් බඩු නෞකාගත කිරීමේ දිනය (හැකි සෑමවිටම) පමා කිරීමට සවකීය සැපයුම්කාරයින් සමග කටයුතු සළස්වා ගන්නා මෙන් ආනයනකයින්ගෙන් වැඩිදුරටත් ඉල්ලා සිටිනු ලැබේ.

7. ස්ථාපිත ආනයනකයින් වෙත ලියා පදිංචි කිරීමේ පරිපාටියක් යටතේ මෙම පාලනය විසින් නිදහසේ නිකුත් කරනු ලබන පුද්ගලික ආනයන බලපත්‍ර සම්බන්ධයෙන් වූ ආනයන අංක දක්වෙන්නා වූ නිවේදනයක් හැකි ඉක්මනින් නිකුත් කෙරෙන වග ආනයනකයින්ට මෙයින් දැනුම් දෙනු ලැබේ.

සී. මයිල්වාගනම්,
ආනයන හා අපනයන පාලක.

1962 ඔක්තෝබර 13 දින,
කොළඹ දීය.

10-817/4

## 1963 සඳහා කුරුණෑගල දිස්ත්‍රික්කයේ තුවක්කු බලපත්‍ර අළුත්වැඩියා කිරීම

1963 වර්ෂය සඳහා තුවක්කු බලපත්‍ර අළුත්වැඩියා කිරීම 1962 කෝ නොවැම්බර් මස 1 වැනි දින සිට ආරම්භ වේ. බලපත්‍ර අයිතිකරුවන් ඔවුන් පදිංචි ප්‍රදේශයේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි තැනගේ කාර්යාලයෙන් බලපත්‍ර අළුත්වැඩියා කර ගත යුතුයි. එම කාර්යාල මගින් 31. 3. 63 දක්වා බලපත්‍ර අළුත්වැඩියා කෙරේ. එයින් පසු බලපත්‍ර අලුත්වැඩියා කෙරෙන්නේ කුරුණෑගල කච්චේරිය මගින්ය. ඒ ඒ ප්‍රදේශ භාර ආදායම් නිලධාරී වරුන්ගේ ලිපිනයන් පහත දක්වේ.

අ. දඹදෙනි හත්පත්තුවේ ප්‍රා. ආ. නි. තැන, පොල්ගහවෙල.

ආ. දෙවමැදි හත්පත්තුවේ ප්‍රා. ආ. නි. තැන, වාරියපොල.

ඉ. හිරියාල හත්පත්තුවේ ප්‍රා. ආ. නි. තැන, ඉබ්බගමුව.

ඊ. කටුගම්පොල හත්පත්තුවේ ප්‍රා. ආ. නි. තැන, කුලියාපිටිය.

උ. වන්නි හත්පත්තුවේ ප්‍රා. ආ. නි. තැන, දලදගම, මහව.

ඌ. වැඋඩ විල්ලි හත්පත්තුවේ ප්‍රා. ආ. නි. තැන, කුරුණෑගල.

2. බලපත්‍ර ගාස්තු වශයෙන් මුද්දර භාරගනු නොලැබේ. පැරණි බලපත්‍රය නැති වී නම් ඒ වෙනුවට රු. 1ක් ගෙවා බලපත්‍ර පිටපතක් ප්‍රාදේශීය ආදායම් නිලධාරි තැනගෙන් ලබා ගත යුතුය. පැරණි බලපත්‍රය හෝ එහි පිටපතක් ඉදිරිපත් නොකළ අයට අළුත් බලපත්‍රයක් නිකුත් කරණු නොලැබේ. ඉහත සඳහන් කාලසීමාව තුලදී බලපත්‍ර අළුත්වැඩියා කිරීම කුරුණෑගල කච්චේරියේදී කරනු නොලැබේ. 1962 ක් දෙසැම්බර් මස 31 වෙනිදට ප්‍රථමයෙන් නව වර්ෂය සඳහා අළුත් බලපත්‍රයක් නොගත් අයට බලපත්‍ර ගාස්තු සමාන දඩ මුදලකට යටත්වීමට සිදුවේ. 1963 මාර්තු 31 වෙනිදට ප්‍රථමයෙන් බලපත්‍ර අළුත්වැඩියා නොකළ අයට නීති මාර්ගයෙන් දඬුවම් පමුණුවනු ලැබේ.

3. අළුත්වැඩියා කිරීමට ඉදිරිපත් කරණ බලපත්‍ර වලට අයත් තුවක්කු, එම බලපත්‍ර අළුත් කිරීමට ම විසින් බලය දී ඇති නිලධාරි තැන වෙත, බලපත්‍ර නිකුත් කිරීමට පෙර, පරීක්ෂා කිරීම පිණිස ඉදිරිපත් කළ යුතුයි. යම් තුවක්කුවක් පාවිච්චි නොකළ හැකි තත්ත්වයක තිබේ නම් 1962 වර්ෂයට නිකුත් කර තිබෙන බලපත්‍රයත් සමග ප්‍රදේශයේ ආදායම් නිලධාරි තැනට 1962 කේ දෙසැම්බර් 31 වෙනි දිනට ප්‍රථමයෙන් භාරදිය යුතුයි. එසේ නොකළහොත් 1963 වර්ෂයට බලපත්‍රයක් ලබා ගැනීමට සිදුවේ.

ඊ. ඇම්. විජේනායක,
කුරුණෑගල දිස්ත්‍රික්කයේ දිසාපති තැන.

1962 ඔක්තෝබර් මස 8 වැනි දින,
කුරුණෑගල-කච්චේරියේ දීය.

10-533

## 1963 වර්ෂයට තුවක්කු අළුත්වැඩියා කිරීම

තුවක්කු හිමියන් විසින් 1963 වර්ෂයට අවසර පත්‍ර (ලයිසන්) අළුත්වැඩියා කිරීම පිණිස **1962 නොවැම්බර් මස 15 වෙනි දින සිට දෙසැම්බර් 31 වෙනි දින දක්වා ඇති කාලය තුළ ඉල්ලුම් කළ යුතුයි. 1962කේ අවසර පත්‍රද මේ සමග එවිය යුතුයි.** එම අවසර පත්‍රය නොමැති නම්, එක එක අවසර පත්‍රයට රුපියල් (1.00) බැගින් වැඩිපුර මුදලක් ගෙවිය යුතුයි. මේ වැඩිපුර මුදල නැතිවූ අවසර පත්‍රය වෙනුවෙන් නිකුත් කරන සහතිකයට අය කළ යුතු ගාස්තුව පිණිස වෙයි.

1962 නොවැම්බර් මස 15 වෙනි දින සිට දෙසැම්බර් 31 වෙනි දින දක්වා ඇති කාලය තුළදී අවසර පත්‍ර නොගත්හොත් අතිරේක දඩ මුදලක්ද ගෙවන්ට වෙනවා ඇත. එම මුදල අවසර පත්‍රයට අය කරන මුදල හා සමාන මුදලක් වේ.

කොළඹ ප්‍රාදේශිය ආදායම් නිලධාරිතුමාගේ කොට්ඨාශයට අයත් කොළඹ නගර සභාව, දෙහිවල-ගල්කිස්ස නගර සභාව, කෝට්ටේ, කොළොන්නාව පළාත් ආණ්ඩු සභා, මහරගම සුළු නගර සභාව, කෝට්ටේ, ගල්කිස්ස සහ අඹතලෙන් පහළ ගම්කාර්‍ය සභා යන මේ පළාත් පාලන ආයතන සීමාවන් තුළ පදිංචි තුවක්කු හිමියන් විසින් තමන්ගේ අවසර පත්‍ර කොළඹ කච්චේරියේදී අළුත්කර ගත යුතුය.

ඉන් පිට පළාත්වල පදිංචි තුවක්කු හිමියන් විසින් තමන්ගේ 1962කේ අවසර පත්‍රය යවමින් තමන් පදිංචි කොට්ඨාශයේ ආදායම් නිලධාරි (ඞී. ආර්. ඕ.) තැනගෙන් 1963ට අළුත්වැඩියා කරගත යුතුයි.

රිවෝල්වර් සහ පිස්තෝල හිමියන් විසින් බලපත්‍ර අළුත්වැඩියා කිරීමට ඉල්ලුම් කරන විට තම තමන්ගේ රිවෝල්වර් සහ පිස්තෝල පරීක්ෂණය සඳහා ඉදිරිපත් කළ යුතුයි.

තුවක්කු සහ රයිපල් හිමියන් විසින් එකී ආයුධ පරීක්ෂා කිරීම සඳහා ඉදිරිපත් කළ යුත්තේ බලපත්‍රයේ සඳහන්වී ඇති විස්තරවල සහ ආයුධයේ සඳහන්වී ඇති විස්තරවල වෙනසක් ඇතොත් හෝ බලපත්‍රයේ, ආයුධයේ අංකය සඳහන්වී නොතිබුණොත් පමණි.

1963ට ගෙවිය යුතු බලපත්‍ර ගාස්තු පහත සඳහන් වේ :—

| | | රුපියල් |
|---|---|---|
| 1. බෙහෙත් කොටන තනිකානුවේ තුවක්කුවකට | ... | 1 00 |
| 2. බෙහෙත් කොටන කානු දෙකේ තුවක්කුවකට | ... | 2 00 |
| 3. තනිකානුවේ පතරොන් තුවක්කුවකට | ... | 2 50 |
| 4. කානු දෙකේ පතරොන් තුවක්කුවකට | ... | 5 00 |
| 5. කානු තුනේ පතරොන් තුවක්කුවකට | ... | 7.50 |
| 6. රයිපලයකට ... ... | ... | 10 00 |
| 7. පිස්තෝලයකට හෝ රිවෝල්වරයකට | ... | 25 00 |

ජී. බී. තම්බුයියා,
කොළඹ දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්ත.

1962ක්වූ ඔක්තෝබර් මස 15 වෙනි දින,
කොළඹ කච්චේරියේදිය.

10-811

යොමු අංකය : ජේ. 2.

## වෙළෙඳ සමාගම් ආඥා පනත (145 වැනි පරිච්ඡේදය)

### 227 (4) වැනි වගන්තිය යටතේ "සීමාසහිත කලම්බු ඇසැම්බ්ලි රූම්ස් කම්පැනි" විසුරුවා හැරීමේ දැන්වීම

### සාමාජිකයින්ගේ ඉච්ඡානුග නිමා කිරීම

ඇවරකරමින් පවත්නා සීමාසහිත කලම්බු ඇසැම්බ්ලි රූම්ස් කම්පනියේ අවසාන නිමා කිරීමේ රැස්වීමේ වාර්තාව හා සමග ඇවර කරුවන්ගේ ගිණුමේ පිටපතක් ලැබ 1962 සැප්තැම්බර් මස 24 දින ලියාපදිංචි කරන ලද හෙයින්,

යථොක්ත දින සිට තෙමසක් ඉකුත්වූ පසු සීමාසහිත කලම්බු ඇසැම්බ්ලි රූම්ස් කම්පනියේ, වෙළෙඳ සමාගම් ආඥා පනතේ (145 වැනි පරිච්ඡේදය) 227 (4) වැනි වගන්තියේ විධිවිධාන යටතේ විසුරුවා හරින ලද සේ සැලකෙන බව දැන ගනිත්වා.

ඩබ්ලිව්. ඇම්. සෙල්ලයියා,
සමාගම් රෙජිස්ට්‍රාර්.

1962 ඔක්තෝබර් මස 10 දින,
කොළඹ-1, සමාගම් ලියාපදිංචි කිරීමේ
දෙපාර්තමේන්තුවේදී ය.

10-629

---

## 1952 ආහාර පාලන අණපනත් යටතේ දැන්වීමයි

1952 කේ ආහාර පාලන අනපණත් වල III වැනි කොටසේ (ඊ) අක්ෂරය දරණ ශීර්ෂය යටතේ, '4 (3) දරණ ඡේදය අනුව මහජනයා වෙත මෙයින් දන්වා සිටිනුයේ, 21 වැනි වාරයේ හාල් සීට්ටු පොත් 1962 ඔක්තෝබර් 22 වැනි සඳුදා වලංගු වන බවයි. 21 වැනි වාරයේ නොම්මර 1 දරණ කූපනය 1962 ඔක්තෝබර් 22 වැනිදාසින් පටන් ගන්නා සතිය තුළදී ද, නොම්මර 2 දරණ කූපනය 1962 ඔක්තෝබර් 29 වැනිදාසින් පටන් ගන්නා සතිය තුළදී ද යන ක්‍රමයට කූපන් වලංගු වෙනවා ඇත.

ආර්. එල්. ආර්නෝල්ඩා,
ආහාර පාලක.

1962 ඔක්තෝබර් 15 වැනි දින,
කොළඹ දී යා

10-758

---

## දැන්වීමයි

බටහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ අළුත්කුරු කෝරළේ උතුර කරවන ආදායම් පාලක නිළධාරි කොට්ඨාශයේ මීගමු නගර සීමාව තුළ ගවයින් අතර, "මුව සහ කුර" නමැති රෝගය පැතිරී යන බැවි 1957 තේ අංක 33 දරණ (සතුන්ගේ) බෝවන රෝග සම්බන්ධ (සංශෝධිත) ආඥා පනතේ 327 පරිච්ඡේදයේ 4 වැනි වගන්තියේ (1) අතුරු වගන්තිය යටතේ මා විසින් වෂී 1962. 8. 3 දින අංක 13,241 දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ ප්‍රසිඩ කරන ලද, දැන්වීම අද දින සිට අවළංගු වන බව මහජනයාට මෙයින් දැනුම් දෙමි.

අබේරත්න බණ්ඩාරනායක,
රජයේ ප්‍රධාන පශු වෛද නිළධාරි.

1962 ඔක්තෝබර් 9 වැනි දින,
පේරාදෙණියේ, රජයේ ප්‍රධාන පශු වෛද්‍ය
කායාලයේ දීය.

10-707

---

## බෝවෙන රෝග (සතුන්ගේ) ආඥාපනත

රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරි තැන්පත් අබේරත්න බණ්ඩාරනායක වන මම, 1957 අංක 33 දරණ පනතින් සංශෝධිත වූ (470 වෙනි අධිකාරය වන) බෝවන රෝග (සතුන්ගේ) ආඥා පනතෙහි 18 වෙනි වගන්තිය ප්‍රකාර මා වෙත පැවරී ඇති බලතල අනුව—

(1) එකී ආඥා පනතෙහි ද ඒ පනත යටතේ සම්පාදිත සියලු නියෝගවල හා ආඥාවල ද විධිවිධාන ඉෂ්ඨ කිරීම හා ක්‍රියාවේ යෙදීම කොළඹ මහා නගර සභාවෙහි නගරාධිපති වෙත පවරන බව ද,

(2) පූර්වෝක්ත ආඥාපනත යටතේ මා වෙත පැවරෙන හා නියම කෙරෙන සියලුම බලතල හා රාජකාරි කටයුතු, අවශ්‍යයැයි හැඟී යන පරිදි මා විසින් නියම කෙරෙන සීමා කිරීම්වලට යටත්ව එකී කොළඹ මහා නගර සභා සීමාවන් ඇතුළත ඉෂ්ඨ කිරීමට හා ක්‍රියාවේ යෙදවීමට එකී නගරාධිපති වෙත බලය පවරන බව ද,

මහජනයාගේ දැනගැනීම සඳහා මෙයින් නිවේදනය කරමි.

අබේරත්න බණ්ඩාරනායක,
රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරි.

1962 ඔක්තෝබර 12 වැනි දින,
පේරාදෙණියේ, ප්‍රධාන පශු වෛද්‍ය
නිලධාරි තැනගේ කායාලයේ දීය.

10-740

---

## දැන්වීමයි

උතුරු මැද පළාතේ පොළොන්නරුව දිස්ත්‍රික්කයේ තමන්කඩුව කරවන ආදායම් පාලක නිළධාරි කොට්ඨාශයේ මින් විලු ගමේ ගවයින් අතර, "මුව සහ කුර" නමැති රෝගය පැතිරී යන බැවි 1957 තේ අංක 33 දරණ (සතුන්ගේ) බෝවෙන රෝග සම්බන්ධ (සංශෝධිත) ආඥා පනතේ 327 පරිච්ඡේදයේ 4 වැනි වගන්තියේ (1) අතුරු වගන්තිය යටතේ මා විසින් වෂී 1962.9.7 දින අංක 13,293 දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ ප්‍රසිඩ කරන ලද, දැන්වීම අද දින සිට අවළංගු වන බව මහජනයාට මෙයින් දැනුම් දෙමි.

අබේරත්න බණ්ඩාරනායක,
රජයේ ප්‍රධාන පශු වෛද නිළධාරි.

1962 ඔක්තෝබර් 9 වැනි දින,
පේරාදෙණියේ, රජයේ ප්‍රධාන පශු වෛද්‍ය
කායාලයේ දීය.

10-708

---

## දැන්වීමයි

වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ දඹදෙණි හත්පත්තු කරවන ආදායම් පාලක නිළධාරි කොට්ඨාශයේ නුගගහගෙදර ගම්පති කොට්ඨාශයේ නුගගහගෙදර ගමේ ගවයින් අතර, "මුව සහ කුර" නමැති රෝගය පැතිරී යන බැවි 1957 තේ අංක 33 දරණ (සතුන්ගේ) බෝවන රෝග සම්බන්ධ (සංශෝධිත) ආඥා පනතේ 327 පරිච්ඡේදයේ යේ 4 වැනි වගන්තියේ (1) අතුරු වගන්තිය යටතේ මා විසින් වෂී 1962.8.3 දින අංක 13,241 දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ ප්‍රසිඩ කරන ලද, දැන්වීම අද දින සිට අවලංගු වන බව මහජනයාට මෙයින් දැනුම් දෙමි.

අබේරත්න බණ්ඩාරනායක,
රජයේ ප්‍රධාන පශු වෛද නිළධාරි.

1962 ඔක්තෝබර් 13 වැනි දින,
පේරාදෙණියේ, රජයේ ප්‍රධාන පශු වෛද්‍ය
කායාලයේ දීය.

10-714

---

## ප්‍රකාශනයයි

වයඹ පළාතේ හලාවත දිස්ත්‍රික්කයේ පිටිගල් කෝරළේ දකුණ කරවන ආදායම් පාලක නිලධාරි කොට්ඨාශයේ ඉහළ කටුනේරිය ගම්පති කොට්ඨාශයේ දෙමටපිටියේ ගවයින් අතර "රක්තාශ්‍රව" නමැති රෝගය පැතිරී යන බැවින්, රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරි තැන්පත් අබේරත්න බණ්ඩාරනායක වන මම 1957 අංක 33 දරණ (සතුන්ගේ) බෝවෙන රෝග සම්බන්ධ (සංශෝධිත) ආඥා පනතේ 327 වැනි පරිච්ඡේදයේ 4 වැනි වගන්තියේ 1 වැනි අතුරු වගන්තිය යටතේ මට පැවරී තිබෙන බලතල අනුව පහත සඳහන් සීමා ඇතුළත පිහිටි ප්‍රදේශය බෝවෙන රෝග ඇති ප්‍රදේශයක් කොට සලකනු ලබන බව මෙයින් ප්‍රකාශ කරමි:—

උතුරට : ඉහළ කටුනේරිය ; දකුණට : වෙන්නප්පුව සහ කොලින්ජාඩිය ; නැගෙනහිරට : ලුණුවිල සහ සිරිගම්පොල ; බස්නාහිරට : කොලින්ජාඩිය සහ කටුනේරිය.

2. මෙම ආඥා පනතේ 7 වැනි වගන්තියේ ප්‍රකාර, තහනම් කරන ලද, ඉහත සඳහන් සීමා ඇතුළත ප්‍රදේශයට හෝ ඉන් පිටතට ගවයන් හෝ ගවයන් බඳීනලද වාහන හෝ මෙම දැන්වීම මා විසින් අවළංගු කරන තෙක් ගෙන යෑම තහනම් කරමි.

3. තවද, 1937 දී සම්මත කරන ලද "සතුන්ගේ බෝවෙන රෝග" පිළිබඳ නීති මාලාව අනුව තහනම් කරන ලද ප්‍රදේශයක ඒ ඒ නිලධාරීන් විසින් නීත්‍යානුකූලව ක්‍රියා කරන අයුරු ගව හිමියන් හා කරත්ත කරුවන් වෙත මෙයින් සිහිපත් කරවන අතර, එම නීති රීති සම්බන්ධව වැඩි විස්තර මාරාවිල පශු වෛද්‍ය තැනගෙන් හෝ පිටිගල් කෝරළේ දකුණ කරවන ප්‍රාදේශීය ආදායම් පාලක නිලධාරි තැනගේ කායාලයෙන් ලබාගත හැකි බව මෙයින් වැඩිදුරටත් දන්වමි.

4. මෙම ප්‍රකාශනය අද දින පටන් වළංගු වන බව දත යුතුයි.

අබේරත්න බණ්ඩාරනායක,
රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරි තැන.

1962 ඔක්තෝබර් මස 11 වැනි දින,
පේරාදෙනියේ, රජයේ ප්‍රධාන පශු වෛද්‍ය
නිලධාරීගේ කායාලයේ දී ය.

10-715/1

## ප්‍රකාශනයයි

වයඹ පළාතේ හලාවත දිස්ත්‍රික්කයේ පිට්ගල් කෝරළේ දකුණ කරවන ආදායම් පාලක නිලධාරි කොට්ඨාශයේ මැද පළාතේ ගවයින් අතර "මුව සහ කුර" නමැති රෝගය පැතිරී යන බැවින්, රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරි තැන්පත් අබේරත්න බණ්ඩාරනායක වන මම 1957 අංක 33 දරණ (සතුන්ගේ) බෝවෙන රෝග සම්බන්ධ (සංශෝධිත) ආඥා පනතේ 327 වැනි පරිච්ඡේදයේ 4 වැනි වගන්තියේ 1 වැනි අතුරු වගන්තිය යටතේ මට පැවරී තිබෙන බලතල අනුව පහත සඳහන් සීමා ඇතුළත පිහිටි ප්‍රදේශය බෝවෙන රෝග ඇති ප්‍රදේශයක් කොට සලකනු ලබන බව මෙයින් ප්‍රකාශ කරමි :—

උතුරට : මැද පළාත—යටකලන් පත්තු මායිම ; දකුණට : මැද පළාත—කමල් පත්තු සහ ඕතර පළාත මායිම ; නැගෙනහිරට : හලාවත දිස්ත්‍රික්ක මායිම ; බස්නාහිරට : මුහුදු වෙරළ.

2. මෙම ආඥා පනතේ 7 වැනි වගන්තියේ ප්‍රකාර, තහනම් කරන ලද, ඉහත සඳහන් සීමා ඇතුළත ප්‍රදේශයට හෝ ඉන් පිටතට ගවයන් හෝ ගවයන් බඳිනාලද වාහන හෝ මෙම දැන්වීම මා විසින් අවලංගු කරන තෙක් ගෙන යෑම තහනම් කරමි.

3. තවද, 1937 දී සම්මත කරන ලද "සතුන්ගේ බෝවෙන රෝග" පිළිබඳ නීති මාලාව අනුව තහනම් කරන ලද ප්‍රදේශයක ඒ ඒ නිලධාරීන් විසින් නීත්‍යානුකූලව ක්‍රියා කරන අයුරු ගව හිමියන් හා කරත්ත කරුවන් වෙත මෙයින් සිහිපත් කරවන අතර, එම නීති රීති සම්බන්ධව වැඩි විස්තර මාරාවිල පශු වෛද්‍ය තැනගෙන් හෝ පිට්ගල් කෝරළේ දකුණ කරවන ප්‍රාදේශීය ආදායම් පාලක නිලධාරී තැනගේ කායඞාලයෙන් ලබාගත හැකි බව මෙයින් වැඩිදුරටත් දන්වමි.

4. මෙම ප්‍රකාශනය අද දින පටන් වළංගු වන බව දත යුතුයි.

අබේරත්න බණ්ඩාරනායක,
රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරි තැන.

1962 ඔක්තෝබර 9 වැනි දින,
පේරාදෙනියේ, රජයේ ප්‍රධාන පශු වෛද්‍ය
නිලධාරීගේ කායඞාලයේ දී ය.

10-715/2

---

## ප්‍රකාශනයයි

වයඹ පළාතේ පුත්තලම් දිස්ත්‍රික්කයේ ආණමඩුව දෙමළ හත්පත්තුව කරවන ආදායම් පාලක නිලධාරි කොට්ඨාශයේ උප්පල වත්ත පෙරුම කුට්ටුව (පාඬිතපත්තු) සහ තල්ගස්වැව (කරබේ පත්තුව) ගවයින් අතර "රක්තාශ්‍රව" නමැති රෝගය පැතිරී යන බැවින්, රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරී තැන්පත් අබේරත්න බණ්ඩාරනායක වන මම 1957 අංක 33 දරණ (සතුන්ගේ) බෝවෙන රෝග සම්බන්ධ (සංශෝධිත) ආඥා පනතේ 327 වැනි පරිච්ඡේදයේ 4 වැනි වගන්තියේ 1 වැනි අතුරු වගන්තිය යටතේ මට පැවරී තිබෙන බලතල අනුව පහත සඳහන් සීමා ඇතුළත පිහිටි ප්‍රදේශය බෝවෙන රෝග ඇති ප්‍රදේශයක් කොට සලකනු ලබන බව මෙයින් ප්‍රකාශ කරමි :—

උතුරට : පෙරවිලි පත්තුව මායිම ; දකුණට : කුමාර පල්ලම් පත්තුව මායිම ; නැගෙනහිරට : කුරුණෑගල දිස්ත්‍රික්ක මායිම ; බස්නාහිරට : රාජකුමාර වන්නි පත්තුව මායිම.

2. මෙම ආඥා පනතේ 7 වැනි වගන්තියේ ප්‍රකාර, තහනම් කරන ලද, ඉහත සඳහන් සීමා ඇතුළත ප්‍රදේශයට හෝ ඉන් පිටතට ගවයන් හෝ ගවයන් බඳිනාලද වාහන හෝ මෙම දැන්වීම මා විසින් අවලංගු කරන තෙක් ගෙන යෑම තහනම් කරමි.

3. තවද, 1937 දී සම්මත කරන ලද "සතුන්ගේ බෝවෙන රෝග" පිළිබඳ නීති මාලාව අනුව තහනම් කරන ලද ප්‍රදේශයක ඒ ඒ නිලධාරීන් විසින් නීත්‍යානුකූලව ක්‍රියා කරන අයුරු ගව හිමියන් හා කරත්ත කරුවන් වෙත මෙයින් සිහිපත් කරවන අතර, එම නීති රීති සම්බන්ධව වැඩි විස්තර පුත්තලම පශු වෛද්‍ය තැනගේ හෝ ආණමඩුව දෙමළ හත්පත්තුව කරවන ප්‍රාදේශීය ආදායම් පාලක නිලධාරී තැනගේ කායඞාලයෙන් ලබාගත හැකි බව මෙයින් වැඩිදුරටත් දන්වමි.

4. මෙම ප්‍රකාශනය අද දින පටන් වළංගු වන බව දත යුතුයි.

අබේරත්න බණ්ඩාරනායක,
රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරී තැන.

1962 ඔක්තෝබර් මස 13 වැනි දින,
පේරාදෙනියේ, රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරීගේ
කාර්යාලයේ දී ය.

10-739/1

---

## ප්‍රකාශනයයි

වයඹ පළාතේ පුත්තලම් දිස්ත්‍රික්කයේ කල්පිටිය කරවන ආදායම් පාලක නිලධාරී කොට්ඨාශයේ එළුවන්කුලම් කොට්ඨාශයේ ගවයින් අතර "රක්තාශ්‍රව" නමැති රෝගය පැතිරී යන බැවින්, රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරී තැන්පත් අබේරත්න බණ්ඩාරනායක වන මම 1957 අංක 33 දරණ (සතුන්ගේ) බෝවෙන රෝග සම්බන්ධ (සංශෝධිත) ආඥා පනතේ 327 වැනි පරිච්ඡේදයේ 4 වැනි වගන්තියේ 1 වැනි අතුරු වගන්තිය යටතේ මට පැවරී තිබෙන බලතල අනුව පහත සඳහන් සීමා ඇතුළත පිහිටි ප්‍රදේශය බෝවෙන රෝග ඇති ප්‍රදේශයක් කොට සලකනු ලබන බව මෙයින් ප්‍රකාශ කරමි :—

උතුරට : පොම්පරිප්පු කොට්ඨාශය ; දකුණට : කරතිව් සිට පෙරිය නාගවිලු දක්වා සහ පෙරිය නාගවිලු සිට පුලියන්කුලම් දක්වා පාර ; නැගෙනහිරට : දෙමළ හත්පත්තුව කරවන ආදායම් පාලක නිලධාරි කොට්ඨාශයේ රාජවන්නි පත්තුවේ බටහිර මායිම ; බස්නාහිරට : කළපුව.

2. මෙම ආඥා පනතේ 7 වැනි වගන්තියේ ප්‍රකාර, තහනම් කරන ලද, ඉහත සඳහන් සීමා ඇතුළත ප්‍රදේශයට හෝ ඉන් පිටතට ගවයන් හෝ ගවයන් බඳිනාලද වාහන හෝ මෙම දැන්වීම මා විසින් අවලංගු කරන තෙක් ගෙන යෑම තහනම් කරමි.

3. තවද, 1937 දී සම්මත කරන ලද "සතුන්ගේ බෝවෙන රෝග" පිළිබඳ නීති මාලාව අනුව තහනම් කරන ලද ප්‍රදේශයක ඒ ඒ නිලධාරීන් විසින් නීත්‍යානුකූලව ක්‍රියා කරන අයුරු ගව හිමියන් හා කරත්ත කරුවන් වෙත මෙයින් සිහිපත් කරවන අතර, එම නීති රීති සම්බන්ධව වැඩි විස්තර පුත්තලම පශු වෛද්‍ය තැනගෙන් හෝ කල්පිටිය කරවන ප්‍රාදේශීය ආදායම් පාලක නිලධාරී තැනගේ කාර්යාලයෙන් ලබාගත හැකි බව මෙයින් වැඩිදුරටත් දන්වමි.

4. මෙම ප්‍රකාශනය අද දින පටන් වලංගු වන බව දත යුතු යි.

අබේරත්න බණ්ඩාරනායක,
රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරී තැන,

1962 ඔක්තෝබර් මස 13 වැනි දින,
පේරාදෙනියේ, රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරීගේ
කාර්යාලයේ දී ය.

10-739/2

---

## දැන්වීමයි

### මාර/සිද්ධාර්ථෝදය පිරිවෙන, ඉසදීන් නගරය, මාතර

දකුණු පළාතේ මාතර, ඉසදීන් නගරයේ පිහිටි ඉහත සඳහන් පිරිවෙන රජයේ ආධාර ලබන පිරිවෙනක් ලෙස තාවකාලික වශයෙන් 61.11.11 දින සිට ලියා පදිංචිකළ බව මෙයින් දන්වමි.

ඇස්. ඇෆ්. ද සිල්වා,
අධ්‍යාපනාධ්‍යක්ෂ.

ඊ. එස්. බී. 10,
කොළඹ 2, මැලේ වීදියේ,
අධ්‍යාපන දෙපාර්තමේන්තුවේදීය.
1962.10.11.

10-757

---

## ලංකා දුම්රිය සේවය

### දුම්රිය මාර්ගය හරහා මහා මාර්ගය වැටී ඇති ස්ථාන අළුත්වැඩියා කිරීම

හලාවත දුම්රිය මාර්ගයේ ජාඇළ සහ සීදූව දුම්රිය ස්ථාන අතර සැ. 13 දම්. 21 පුරුක් 30 [illegible]ථානයෙන් යක්කඩුව-නිවන්දම මහා මාර්ගය දිවෙන ස්ථාන[illegible] අළුත්වැඩියා කිරීම සඳහා මෙම ඔක්තෝබර් මස 25 වැනි බ්‍රහස්[illegible]දා පස්වරු 6 සිට රාත්‍රී 9 දක්වාත්, පසුදි[illegible] උදේ 4 සිට 6 දක්වාත් රථවාහන ගමනාගමනය අවුරාලීමට අර්ධ වශයෙන් වසාතබන අතර 25 වැනි බ්‍රහස්පතින්දා රාත්‍රී 9 සිට පසුදින් අළුයම 4 දක්වා සම්[illegible]යෙන්ම වසාතබනු ලැබේ.

මේ කාලය තුළදී රථවාහන කපාලිකන්ද මාර්ගයෙන් ධාවනය කළ විය යුතුය.

10-748

## ගමනාගමනය සඳහා වසා තැබීම

**දකුණු කොට්ඨාශය** **ගාල්ල දිස්ත්‍රික්කය**

**තවලම-නෙල්ලුව පාරේ අංක ⅓ දරණ පාලම උඩින් ගමනාගමනය**

තවලම-නෙල්ලුව පාරේ අංක ⅓ දරණ පාලම, 62.10.15 සිට 62.12.15 දක්වා මාස 2ක කාලයකට රථවාහන ගමනාගමනයට වසා තබනවා ඇත.

මේ වෙනුවට ප්‍රයෝජනයට ගත හැකි අන් මාර්ගයක් නොමැත.

එච්. කේ. ඇම්. ප්‍රනාන්දු,
රජයේ වැඩ අධ්‍යක්ෂ වෙනුවට.

රජයේ වැඩ දෙපාර්තමේන්තුව,
කොළඹ 1.
62.10.15.

10-808

## රථවාහනවලට අවහිර

**දකුණු කොළඹ දිස්ත්‍රික්කයේ කෝට්ටෙ-බෝපෙ පාර**

ඇතුල් කෝට්ටෙ මංසන්ධියේ සිට බත්තරමුල්ල මංසන්ධිය දක්වා වූ කෝට්ටෙ-බෝපෙ මාර්ග කොටස වසා තැබීමේ කාලය 1962.11.22 වෙනි දින තෙක් දීර්ඝකොට ඇති බව සාමාන්‍ය මහජනයාගේ දැන ගැනීම සඳහා මෙයින් නිවේදනය කරමි.'

මේ හැරුණු විට ඇති අනිකුත් මාර්ගය වැලිකඩ සහ කලපලුවාව හරහා ඇති මාර්ගයයි.

ඒ. සී. පෙරේරා,
රජයේ වැඩ අධ්‍යක්ෂ වෙනුවට.

රජයේ වැඩ කාර්යාලය,
කොළඹ 1.
1962 ඔක්තෝබර් මස 15 වෙනි දින.

10-807

**සෑම සිකුරාදා දිනයකම ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියකදීම පළ කරන දිනය වෙනස් විමට ඉඩ තිබේ.**

**ගැසට් පත්‍රය පළ කරන දින සිට කාර්යාලය වැඩ කරන දින හතරකට ප්‍රථම පස්වරු 3.30 ට සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි (සාමාන්‍ය වශයෙන් සඳුදා පස්වරු 3.30 ට ප්‍රථමයෙන්).**

**ගැසට් පත්‍රය ලබාගැනීම සඳහා දයකමුදල් කොළඹ, මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙලින්ම ගෙවිය යුතුය. ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දයකමුදල් භාරගනු නොලැබේ.**

ලංකාවේ වාලච්චේනයෙහි පිහිටි "ඊස්ටර්න් පේපර් මිල්ස් කෝපරේෂන්" හි නිපදවන ලද කඩදාසිවල
ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රාපිතයි